# සටහන

2016 ජූලි - අගෝස්තු 7 - 8 කලාපය




2 ලාඕසයේ සමාජ, ආර්ථික තොරතුරු බිඳක්


3 සංචාරක කර්මාන්තය: අභියෝග සහ අපේක්ෂා

7 ශ්‍රී ලංකාවේ උසස් අධ්‍යාපනය ලබා දීම සඳහා රාජ්‍ය නොවන අංශයේ සහභාගිත්වය

11 ජනගහනය වියපත් වීම: අභියෝග හා ඉදිරි දැක්ම

15 බැංකුවල සුරක්ෂිතභාවය සහ ශක්තිමත්භාවය තහවුරු කිරීම සඳහා හඳුන්වා දෙන ලද නව නියාමන සහ අධීක්ෂණ ක්‍රමවේද


රු. 20/-





ISSN 1391-3697
01678
9 770041 001205



ශ්‍රී ලංකා මහ බැංකුව
සන්නිවේදන දෙපාර්තමේන්තුව



# ලාඕසය

## සමාජ, ආර්ථික තොරතුරු බිඳක්...

| | |
|---|---|
| භූමි ප්‍රමාණය<br>මුළු ප්‍රමාණය<br>ගොඩ බිම් ප්‍රමාණය<br>අභ්‍යන්තර ජලාශ | <br>වර්ග කි.මී. 236,800<br>වර්ග කි.මී. 230,800<br>වර්ග කි.මී. 6,000 |
| ජනගහනය (2017 ජූලි ඇස්තමේන්තු) | 7,126,706 |
| ජනගහන වර්ධන වේගය (2017 ඇස්තමේන්තු) | 1.51% |
| උපත් අනුපාතය (2017 ඇස්තමේන්තු) (ජනගහනය දහසකට) | 23.6 |
| මරණ අනුපාතය (2017 ඇස්තමේන්තු) (ජනගහනය දහසකට) | 7.4 |
| උපතේදී ජීවිත අපේක්ෂාව (අවුරුදු) (2017 ඇස්තමේන්තු) | 64.6 |
| ළදරු මරණ අනුපාතය (2017 ඇස්තමේන්තු) (සජීවී උපත් දහසකට) | 49.9 |
| දළ දේශීය නිෂ්පාදිතය (2016 ඇස්තමේන්තු) | එක්සත් ජනපද ඩොලර් බිලියන 17.15 |
| මූර්ත දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධන වේගය (2017 ඇස්තමේන්තු) | 6.9% |
| ඒක පුද්ගල දළ දේශීය නිෂ්පාදිතය (2017 ඇස්තමේන්තු) | එක්සත් ජනපද ඩොලර් 7,400 |
| දළ දේශීය නිෂ්පාදිතයේ ආංශික සංයුතිය (2016 ඇස්තමේන්තු) | |
| කෘෂිකර්මය | 20.9% |
| කර්මාන්ත | 33.2% |
| සේවා | 39.1% |
| ශ්‍රම බලකාය (2017 ඇස්තමේන්තු) | මිලියන 3.582 |
| සේවා වියුක්තිය (2016 ඇස්තමේන්තු) | 1.5% |
| කුටුම්භ ආදායමේ ගිනි සංගුණකය (2008) | 36.7 |
| අයවැය අතිරික්තය (+) හෝ හිඟය (-) දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස (2017 ඇස්තමේන්තු) | -5.6% |
| උද්ධමන අනුපාතය (2017 ඇස්තමේන්තු) | 2.3% |
| ආනයන (2017 ඇස්තමේන්තු) | එක්සත් ජනපද ඩොලර් බිලියන 5.852 |
| ආනයන භාණ්ඩ | යන්ත්‍රෝපකරණ, මෝටර් රථ, ඇවි තෙල්, පාරිභෝගික භාණ්ඩ |
| අපනයන (2017 ඇස්තමේන්තු) | එක්සත් ජනපද ඩොලර් බිලියන 2,881 |
| අපනයන භාණ්ඩ | ලී භාණ්ඩ, කෝපි, විදුලිය, තඹ, ටින්, රත්‍රං, මඤ්ඤොක්කා |

මූලාශ්‍රය: The World Fact Book

# ලාඕසය

ලාඕ මහජන ප්‍රජාතන්ත්‍රවාදී ජනරජය ලෙස නිල වශයෙන් හැඳින්වෙන ලාඕසය හතර වටින් ම ගොඩබිමින් වට වූ අග්නිදිග ආසියාතික රාජ්‍යයක්. වයඹ දෙසින් මියැන්මාරයෙන් සහ චීනයෙන් ද, නැගෙනහිරින් වියට්නාමයෙන් ද නිරිත දෙසින් කාම්බෝජයෙන් ද බටහිර හා නිරිත දෙසින් තායිලන්තයෙන් ද මායිම් වී ඇති ලාඕසය වසර දහස් ගනණක් පැරණි ප්‍රාග් ඓතිහාසික උරුමයක් ඇති රටක්. අග්නිදිග ආසියාවෙන් මෙතෙක් හමු වී ඇති පැරණි ම නූතන මානව පොසිලය වන වසර 46,000ක් පමණ පැරණි හිස් කබලක් ලාඕසයෙන් ලැබී තිබෙනවා.

1893 දී ප්‍රංශයේ යටත් රාජ්‍යයක් බවට පත් වූ ලාඕසය 1949 දී නිදහස ලැබුවා. විදෙස් ආයෝජන සහ අසල්වැසි රටවල් සමග කරන වෙළෙඳාම මත යැපෙන ආර්ථිකයක් හිමි ලාඕසය, ඕපියම් පොපි නිෂ්පාදනය කෙරෙන "ආසියානු රන් ත්‍රිකෝණය" ලෙස සැලකෙන රටවල්වලින් එකක්.

මූලාශ්‍රය: Wikipedia විශ්වකෝෂය

"සටහන" සඟරාවෙහි පළවන අදහස් ඒ ඒ ලේඛකයන් ගේ අදහස් මිස ශ්‍රී ලංකා මහ බැංකුවේ අදහස් නොවිය හැකි ය.

ශ්‍රී ලංකා මහ බැංකුව නමට ලියන ලද මුදල් ඇණවුම්/චෙක්පත් මෙහි සඳහන් ලිපිනයට එවීමෙන් "සටහන" තැපෑලෙන් ගෙන්වා ගත හැකි ය.

පිටපතක මිල : රු. 20.00
වාර්ෂික දායකත්වය : රු. 480.00
(තැපැල් ගාස්තු ද ඇතුළත්ව)

අධ්‍යක්ෂ
සන්නිවේදන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව
තැ. පෙ. 590, කොළඹ

# සංචාරක කර්මාන්තය: අභියෝග සහ අපේක්ෂා


විවිධ ගැටලු සහ අභියෝග මධ්‍යයේ වුවද, ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තය පශ්චාත් ගැටුම්කාරී ආර්ථිකයේ විශාලතම අංශවලින් එකක් මෙන්ම, වේගයෙන්ම වර්ධනය වන ආර්ථික අංශය බවට පත්වෙමින් ශීඝ්‍ර පුළුල් වීමකට සහ විවිධාංගීකරණයට ලක්විය. 2009 වසරේ දී 448,000 ක් වූ ශ්‍රී ලංකාවට පැමිණි සංචාරකයින් ප්‍රමාණය 2015 වසරේ දී මිලියන 1.8ක් දක්වා වර්ධනය වී ඇත. සංචාරක ඉපැයීම් ද 2009 වසරේ දී වූ එ.ජ. ඩොලර් මිලියන 349 හි සිට 2015 වසරේ දී එ.ජ. ඩොලර් මිලියන 2,981 ක් දක්වා විශාල ලෙස ඉහළ ගොස් ඇති අතර, එය සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ සහ ඇඟලුම් අපනයන ආදායමට පසු තෙවැනි විශාලතම විදේශ විනිමය උත්පාදන අංශය බවට පත් වී ඇත.

වසර ගණනාවක සිට ශ්‍රී ලංකාවට වැඩිම සංචාරකයින් ප්‍රමාණයක් පැමිණෙන රට ඉන්දියාව වූ අතර, වේගයෙන් වර්ධනය වන චීන සංචාරක පැමිණීම් එක්සත් රාජධානියේ සංචාරක පැමිණීම් අභිබවා යමින් දෙවන ස්ථානයට පැමිණ ඇත. තවද, ජර්මනිය සහ මාලදිවයින ද 2015 වසරේ සංචාරක පැමිණීම් අතර ඉදිරියෙන් පසු වේ. ශ්‍රී ලංකා සංචාරක කර්මාන්තය පිළිබඳව "ලෝන්ලි ප්ලැනට්" සඟරාව, ප්‍රංශයේ "කොන්ඩේ නාස්ට්" සඟරාව, "ෆොබ්ස් සඟරාව", "ෆොක්ස්" ප්‍රවෘත්ති ඒජන්සිය සහ එක්සත් රාජධානියේ "සන්ඩේ ටයිම්ස්" වැනි ලොව පිළිගත් මාධ්‍ය සංවිධාන වෙතින් ලැබෙන ප්‍රශංසාවන් ඉහළ ගොස් ඇත.

### වර්ධන ශක්‍යතාව

ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තයට තවදුරටත් වර්ධනය වීම සඳහා ඉතා ඉහළ ශක්‍යතාවක් පවතී. පහත සංඛ්‍යා

**සංචාරක ව්‍යාපාරයේ වර්ධන ප්‍රවණතා 1970 සිට 2015**




සටහනෙහි දැක්වෙන පරිදි ශ්‍රී ලංකාව ලෝකයේ මුළු සංචාරක පැමිණීම්වලින් සියයට 0.13කට ද, මුළු සංචාරක ඉපැයීම්වලින් සියයට 0.2කට ද දායක වේ. ඒ අනුව, ශ්‍රී ලංකාව ලෝක සංචාරක කර්මාන්තයට ඉතාම අඩු ප්‍රතිශතයකින් දායක වී ඇති බැවින් ඉදිරියේ දී සිය සංචාරක කර්මාන්තය ඉතා විශාල වශයෙන් වර්ධනය කර ගැනීමේ ශක්‍යතාවක් පවතී.

**2014 වසරේ තෝරාගත් රටවල සංචාරක පැමිණීම් සහ ඉපැයීම්**

| රට/කලාපය | 2014 වසරේ සංචාරක පැමිණීම් සංඛ්‍යාව ('000) | වෙළඳපොළ ප්‍රතිශතය (%) | 2014 වසරේ සංචාරක ඉපැයීම් (එ.ජ. ඩොලර් මිලියන) | වෙළඳපොළ ප්‍රතිශතය |
|---|---|---|---|---|
| සමස්ථ ලෝකයේම | 1,133,000 | 100.00 | 1,245,000 | 100.00 |
| එයින්, ආසියා හා පැසිෆික් කලාපය | 263,305 | 23.24 | 376,815 | 30.27 |
| හොංකොං | 27,770 | 2.45 | 38,376 | 3.08 |
| සිංගප්පූරුව | 11,858 | 1.05 | 19,203 | 1.54 |
| ඉන්දියාව | 7,703 | 0.68 | 19,700 | 1.58 |
| මාලදිවයින | 1,205 | 0.11 | 2,661 | 0.21 |
| **ශ්‍රී ලංකාව** | **1,527** | **0.13** | **2,431** | **0.20** |

මූලය: ලෝක සංචාරක සංවිධානය

ලෝක සංචාරක කවුන්සිලය (World Travel and Tourism Council) විසින් සිදු කරන ලද ඇස්තමේන්තුවලට අනුව ශ්‍රී ලංකාවේ දළ දේශීය නිෂ්පාදිතයට සහ සේවා නියුක්තිය වෙනුවෙන් විදේශ ගමන් සහ සංචාරක සේවා අංශයේ සෘජු සහ මුළු ආයකත්වය[1], ලෝක සහ ආසියා පැසිෆික් කලාපීය සාමාන්‍යයට වඩා ඉහළ මට්ටමක පවතී. එසේ වුවද, කලාපීය තරගකරුවන් වන මාලදිවයින, කාම්බෝජය, තායිලන්තය සහ මැලේසියාව වැනි රටවල් සමග සැසඳීමේ දී දළ දේශීය නිෂ්පාදිතය සහ සේවා නියුක්තිය යන අංශ දෙක සඳහාම ශ්‍රී ලංකාවේ විදේශ ගමන් හා සංචාරක සේවා අංශයෙහි සෘජු සහ මුළු ආයකත්වය පහළ අගයක් ගන්නා අතර, සිය වර්ධන හැකියාවන් නිසි ලෙස භාවිත කර නොමැති බවක් එමගින් පෙන්නුම් කරයි.

ස්වභාව සෞන්දර්යය, සුව පහසු දේශගුණය, ඓතිහාසික හා සංස්කෘතික උරුමය සහ ආගමික විවිධත්වය වැනි කරුණු ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තයේ වර්ධන ශක්‍යතාවන් ලෙස සාම්ප්‍රදායිකව සලකා ඇත. තවද, රටක පවතින ආරක්ෂාව සහ සුරක්ෂිතභාවය එම රටේ සංචාරක කර්මාන්තයේ උන්නතිය සඳහා විශාල වශයෙන් බලපානු ලබයි. වර්තමානයේ දී ලෝකයේ ත්‍රස්තවාදී උවදුරෙන් තොර සංචාරක ගමනාන්ත කිහිපය අතුරින් එකක් බවට ශ්‍රී ලංකාව පත් වී ඇත. තවද, කිලෝමීටර 1,500 ක් දිගට විහිදුනු වෙරළ තීරයක් හිමි රටක් වුවද, ශ්‍රී ලංකාව එහි සැබෑ හැකියාවන් උපයෝජනය කර ගැනීමට අපොහොසත්ව ඇත. එ බැවින් ශ්‍රී ලංකාවේ සංචාරක ව්‍යාපාරයේ ඉහළ දියුණුවක් ලබාගත හැකි උප කාණ්ඩ ලෙස රැස්වීම්, සම්මන්ත්‍රණ හා උත්සව සඳහා වන MICE සංචාරක ව්‍යාපාරය[2], සුව සංචාරක ව්‍යාපාරය, පාරිසරික සංචාරක ව්‍යාපාරය, ත්‍රාසජනක කටයුතු (Adventures) සඳහා වන සංචාරක ව්‍යාපාරය, විවේකය අරමුණු කරගත් සංචාරක ව්‍යාපාරය, කෘෂි සංචාරක ව්‍යාපාරය, මගී යාත්‍රා සහ සාමුද්‍රික සංචාරක ව්‍යාපාරය, ග්‍රාමීය හා නාගරික සංචාරක ව්‍යාපාරය, විනෝදාස්වාදය අරමුණු කරගත් සංචාරක ව්‍යාපාරය හැඳින්විය හැකිය.

සංචාරක ව්‍යාපාරයේ ඉහත උප කාණ්ඩවල හැකියාවන් උපයෝජනය කර ගැනීම සඳහා ජාතික උරුමයන් සහ පරිසරය ආරක්ෂා කර ගනිමින් ආර්ථිකයේ සියලුම අංශ ආවරණය වන පරිදි ව්‍යුහාත්මක වෙනස්කම් සිදු කළ යුතු වන අතර, ඊට අමතරව යටිතල පහසුකම් සංවර්ධනය මගින් ඒ සඳහා විශාල සහයක් ලබාදිය යුතුව ඇත. මේ සඳහා සුබදායක ලෙස රජය මගින් 2016 ජනවාරි මාසයේ එළිදැක්වූ, යෝජිත මහානගර (Megapolis) හා බස්නාහිර සංවර්ධන සැලසුම මගින් ද 2016 වර්ෂය සඳහා වූ රජයේ අයවැය මගින් ද විභවතාවක් පවතින නව අංශ කෙරෙහි සෘජු අවධානය යොමු කරමින් සංචාරක අංශයේ සංවර්ධනය සඳහා යෝජනා ඉදිරිපත් කර ඇත.

## සංචාරක කර්මාන්තය මුහුණ දෙන අභියෝග

ආර්ථිකයක වර්ධනය වෙමින් පවතින ඕනෑම කර්මාන්තයක් අභියෝග රැසකට මුහුණ දෙන අතර, ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තයට ද එය එලෙසින්ම බලපා ඇත. ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තය මුහුණ දෙන ප්‍රධාන අභියෝග ලෙස විශේෂඥයන් විසින් පහත සඳහන් කරුණු හඳුනාගෙන ඇත.

- **සංචාරකයින්ගේ අපේක්ෂිත වර්ධනයට සමගාමීව හෝටල් කාමර ප්‍රමාණවත් නොවීම:** ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශයට අනුව 2016 වසර සඳහා මිලියන 2.2 කට වඩා වැඩි සංචාරක පැමිණීම් ප්‍රමාණයක් අපේක්ෂා කරනු ලබයි. මෙවැනි විශාල සංචාරකයින් ප්‍රමාණයකට පහසුකම් සැලසීම සඳහා හෝටල් කාමර 40,000 ත් 50,000 ත් අතර ප්‍රමාණයක් අවශ්‍ය වන බවට ඇස්තමේන්තු කර ඇති අතර, 2015 වන විට සංචාරක හෝටල් සහ අතිරේක ආයතන යන දෙඅංශයම සතුව පැවතියේ හෝටල් කාමර 30,000 ක පමණ ප්‍රමාණයකි. 2016 වසරේ දී හෝටල් කාමර 6,400 කට වැඩි ප්‍රමාණයක් අලුතින් එකතු කිරීමට අපේක්ෂිත අතර, පහසුකම් වර්ධනය කිරීම සඳහා තවත් නව හෝටල් ව්‍යාපෘතීන් විශාල ප්‍රමාණයක් ක්‍රියාත්මක වීමට නියමිතව ඇත. කෙසේ වුවද, හෝටල් කාමර සංඛ්‍යාව ඉහළ දැමීම කෙරෙහි අවධානය යොමු නොකළ හොත් ඉහළ යන සංචාරක පැමිණීම සඳහා

1 ලෝක සංචාරක කවුන්සිලයට අනුව, ද.දේ.නි. සඳහා විදේශ ගමන් හා සේවා අංශයේ සෘජු ආයකත්වය ලෙස ගණනය කරනු ලබන්නේ, කිසියම් රටක් තුළ එහි නේවාසික හා අනේවාසික පුද්ගලයන් විසින් ව්‍යාපාරික හා විවේකය අරමුණු කරගෙන විදේශ ගමන් සහ සංචාරක සේවා සඳහා කරන වියදම මෙන්ම, රජය විසින්, විදේශ සංචාරකයින්ට සේවා සැපයීම සඳහා සෘජු සම්බන්ධතාවක් ඇති කෞතුකාගාර, ජාතික වනෝද්‍යාන, හෝටල්, ගුවන් සේවා, ගුවන් තොටුපොළ, සංචාරක නියෝජිතායතන, විවේකය හා විනෝදාස්වාදය සපයන සේවා සඳහා කරනු ලබන වියදම් ය. ද.දේ.නි. සඳහා විදේශ ගමන් හා සේවා අංශයේ මුළු ආයකත්වය ලෙස ආර්ථිකයක් වෙත වක්‍ර සහ ප්‍රේරණ බලපෑම් ද ඇතුළත් වඩාත් විහිදුනු පරාසයක් ඇතුළත් වේ.

2 සාකච්ඡා, සම්මන්ත්‍රණ, ප්‍රදර්ශන වැනි විශේෂිත අරමුණක් වෙනුවෙන් සහභාගි වන කණ්ඩායමක් සඳහා කලින් සැලසුම් කරන ලද සංචාරක කටයුතු. (Meetings, Incentives, Conferences and Exhibitions (MICE)).

පහසුකම් සැලසීමට පවතින පහසුකම් කිසිසේත්ම ප්‍රමාණවත් නොවනු ඇත.

- **පුහුණු සේවකයින්ගේ අවශ්‍යතාව සහ ශ්‍රම සංක්‍රමණය:** සංචාරක කර්මාන්තයේ නියැලුණු ශ්‍රී ලාංකික පුහුණු ශ්‍රමිකයින් විශාල පිරිසක් ඉහළ වැටුප් වෙනුවෙන් විදේශීය රටවල සේවයේ යෙදී සිටිති. සංචාරක කර්මාන්තයේ බලාපොරොත්තු වන ඉහළ වර්ධනය සඳහා පහසුකම් සැපයීමට පවතින නිත්‍ය මිනිස් බල සැපයුම ද ප්‍රමාණවත් නොවේ. සංචාරක කර්මාන්තයේ ඉහළ යන පුහුණු ශ්‍රමික අවශ්‍යතා සපුරා ගැනීම සඳහා අවශ්‍ය සේවක පුහුණු කිරීම් රජයට තනිව සිදු කිරීමට නොහැකි අතර, ඒ සඳහා රාජ්‍ය හා පෞද්ගලික අංශ හවුල්ව කටයුතු කිරීම අත්‍යවශ්‍ය වේ.

- **ලෝක ප්‍රසිද්ධ හෝටල් දාම ශ්‍රී ලංකාව වෙත දක්වා ඇති අවධානය ප්‍රමාණවත් නොවීම සහ කොළඹ හෝටල් සඳහා පනවා ඇති අවම කාමර ගාස්තුව:** මෑත කාලයේදී ගෝලීය හෝටල් දාම ශ්‍රී ලංකාව වෙත අවධානය යොමු කළ ද, බොහෝ ප්‍රමුඛ පෙළේ හෝටල් දාම ඔවුන්ගේ හෝටල් ව්‍යාපාර ශ්‍රී ලංකාව වෙත තවමත් ප්‍රමාණවත් පරිදි ව්‍යාප්ත කර නොමැති ආකාරයක් පෙන්නුම් කරයි. ෆෝබ්ස් සඟරාව නම්කර ඇති ලොව හොඳම අන්තර්ජාතික සුඛෝපභෝගී හෝටල් දාම සන්නාම 10 අතුරින් ශ්‍රී ලංකාවේ දක්නට ඇත්තේ හෝටල් දාම තුනක් පමණි. ඒ අතර, කොළඹ තරු පන්තියේ හෝටල් වෙත රජය මගින් පනවා ඇති අවම කාමර ගාස්තුව මගින් වර්ධන අවධියක පවතින සංචාරක කර්මාන්තය කෙරෙහි ඇති කරන වාසි සහ අවාසි පිළිබඳව බරපතල ලෙස සලකා බැලිය යුතුව ඇත.

- **සංචාරක ව්‍යාපාරයේ උපායමාර්ගික අවධානය ඉහළ, මැද සහ පහළ පෙළ සංචාරකයින් වෙත යොමු කිරීම:** ශ්‍රී ලංකාව සාපේක්ෂව අඩු වියදම් සහිත ගෙවන මුදලට වටිනාකමක් ලබාදෙන සංචාරක ගමනාන්තයක් ලෙස සලකනු ලැබුව ද ඉහළ පෙළේ සංචාරකයින්ගේ ආකර්ෂණය ශ්‍රී ලංකාව වෙත ලබා ගැනීම සඳහා බොහෝ සාකච්ඡා සිදු වී ඇත. වර්තමානයේ එ.ජ. ඩොලර් 164 ක් වැනි අගයක පවතින සංචාරකයෙකුගේ දෛනික වියදම තවදුරටත් ඉහළ නැංවීම සඳහා ඉහළ පෙළේ සංචාරකයින් ආකර්ෂණය කර ගැනීම උපකාරී වේ. ඒ අතර ම, ඉහළ පෙළේ සංචාරකයන් කෙරෙහි පමණක් නැඹුරු වීම මගින් සංචාරක කර්මාන්තය අවදානමට ලක්විය හැකි බැවින් ශ්‍රී ලංකාව වැනි රටක් ඉහළ, මැද සහ පහළ පෙළ යන සියලුම සංචාරකයින්ගේ ආකර්ෂණය ලබාගැනීම සඳහා අවශ්‍ය වන ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග කෙරෙහි යොමු වීම වඩා ආරක්ෂාකාරී වේ.

- **අවිධිමත් අංශය අන්තර්ග්‍රහණය කිරීම:** සංචාරක කර්මාන්තයේ විධිමත් අංශය හොඳින් නියාමනය වී තිබුණ ද, කර්මාන්තය තුළ සැලකියයුතු අවිධිමත් අංශයක් ක්‍රියාත්මක වෙමින් පවතී. එබැවින්, විධිමත් අංශය වෙත එම කොටස ද අන්තර්ග්‍රහණය කර ගැනීම සඳහා අවධානය යොමු කිරීම අත්‍යවශ්‍ය වන අතර, එමගින් නිසියාකාර නියාමනයක් සඳහා ඉඩ සැලසෙනු ඇත. අවිධිමත් අංශය තුළ සංචාරක කර්මාන්තයේ ආරක්ෂාව සහ ආචාරධර්ම වැඩිදියුණු කිරීම අත්‍යවශ්‍ය වන අතර, එසේ කිරීමට අපොහොසත් වීම රටෙහි යහපත් ප්‍රතිරූපය බිඳ වැටීමට හේතු වනු ඇත. තවද, අවිධිමත් අංශය හා සම්බන්ධ විශ්වසනීය තොරතුරු නොමැති වීම සංචාරක කර්මාන්තය හා සම්බන්ධ ඉදිරි සැලසුම් සැකසීමේ දී ගැටලු නිර්මාණය කරනු ඇත.

- **විශාල විභවතාවක් පවතින චීනයෙන් පැමිණෙන සංචාරකයින්ගේ වර්ධනයට සරිලන සේ පහසුකම් සැපයීමට ඇති හැකියාව:** සංචාරක කර්මාන්තයේ දැනට පවතින වර්ධනය වෙමින් පවතින චීන සංචාරකයින් සඳහා අවශ්‍ය පහසුකම් සපුරාලීමේ දී නව අභියෝග නිර්මාණය වී ඇත. එහිදී චීන භාෂාවෙන් විකාශනය වන රූපවාහිනී සහ ගුවන්විදුලි නාලිකා, චීන භාෂාව කථා කරන සංචාරක මගපෙන්වන්නන් යනාදිය අවශ්‍ය වනු ඇත.

- **නැවතී සිටින රාත්‍රී සංඛ්‍යාව ලෙස ගණනය කරනු ලබන සංචාරකයෙකු නැවතී සිටින සාමාන්‍ය කාලසීමාව වසර ගණනාවක් පුරා එක ලෙසම පැවතීම:** දෛනික සංචාරක වියදම පසුගිය වසර කීපය පුරා වර්ධනය වී තිබුණ ද ප්‍රධාන වශයෙන්ම සංචාරකයින් සඳහා ශ්‍රී ලංකාවේ පවතින ක්‍රියාකාරකම් අඩු වීම නිසා සංචාරකයකු නැවතී සිටින සාමාන්‍ය කාලසීමාව සංචාරක රාත්‍රීන් 10 ක් පමණ ලෙස නොවෙනස්ව පවතී. එමනිසා ශ්‍රී ලංකාවේ පවතින සංචාරක ආකර්ෂණයන් විවිධාංගීකරණය කිරීම සඳහා ප්‍රතිපත්තිමය තීරණ ගත යුතු වන අතර, එහිදී සංචාරක රාත්‍රීන් සංඛ්‍යාව අවම වශයෙන් සති දෙකක් ලෙස ඉලක්ක කිරීම සඳහා, මගී නෞකා සහ සාමුද්‍රික සංචාර, විවේකය අරමුණු කරගත් සංචාර සහ විනෝදාස්වාදය අරමුණු කරගත් සංචාර වැනි සංචාරක කර්මාන්තයේ පසුගාමී අංශ කෙරෙහි

වඩාත් අවධානය යොමු කළ යුතුය. කෙසේ වුවද, ශ්‍රී ලංකාව දකුණු ආසියාවේ සැපයුම්, මූල්‍ය, වෙළඳ සහ තොරතුරු කේන්ද්‍රස්ථානයක් බවට සංවර්ධනය කිරීම සඳහා යෝජනා ගෙන ඒමත් සමග නැවතී සිටිනා සාමාන්‍ය කාලසීමාව අඩු, ව්‍යාපාර කටයුතු සඳහා පැමිණෙන සංචාරකයින්ගේ පැමිණීම් ඉහළ යනු ඇතැයි අපේක්ෂිතය. එමනිසා සංචාරය කිරීමේ අරමුණ අනුව වර්ග කර ඒ අනුව එම සංචාරකයින්ට වෙන් වෙන් වශයෙන් උචිත විවිධ ක්‍රමෝපාය අනුගමනය කිරීම අවශ්‍ය වනු ඇත.

- **නව නිර්මාණාත්මක ප්‍රවේශයක අවශ්‍යතාව:** තොරතුරු ලබාදීම සඳහා පමණක් නොව, බස්රථ, දුම්රිය, කුලීරථ, සහ හෝටල් වෙන්කිරීම්, ජංගම දුරකථන සම්බන්ධතා, වයි-ෆයි සම්බන්ධතා, සංචාර සැලසුම් ආදී වූ පුළුල් පරාසයක පැතිරෙන පරිදි සංචාරකයින් හා සම්බන්ධ සේවාවන් සපයන්නා වූ බහුකාර්ය සංචාරක තොරතුරු මධ්‍යස්ථාන සංඛ්‍යාව ප්‍රධාන සංචාරක ආකර්ෂණයන්හි සහ ප්‍රධාන ප්‍රවාහන කේන්ද්‍රස්ථානයන්හි තවදුරටත් වැඩි කිරීමේ අවශ්‍යතාවයක් පවතී. අධිවේගී අන්තර්ජාල සම්බන්ධතා සමගින් මුළු දිවයිනම ආවරණය වන පරිදි යෝජනා කරන ලද ගූගල් ලූන් ව්‍යාපෘතිය (Google Loon Project) වැනි නව්‍ය ව්‍යාපෘති හරහා, ජංගම දුරකථන හා අන්තර්ජාල ආවරණය වැඩි කිරීම තුළින්, විශේෂයෙන්ම සංචාරකයින්ගේ සම්බන්ධතා සහ සුරක්ෂිතභාවය පිළිබඳ හැඟීම ඉහළ යනු ඇත. සංචාරකයින් සඳහා වූ විශේෂ අවසරපත් (Tourist Pass), සෞන්දර්යාත්මක මාර්ග ඔස්සේ විශේෂ සංචාරක දුම්රිය සේවා සහ බස් චාරිකා, තද බෑවුම් සහිත කඳු තරණය කරනා දුම්රිය මාර්ග (Funicular Railway Routes), කේබල් කාර්, උසස් තත්ත්වයේ විනෝද උයන්, දේශීය මගී යාත්‍රා සහ කුඩා බෝට්ටු සේවා වැනි පහසුකම් ද සමගින් සුදුසු සංචාරක හිතකාමී පොදු ප්‍රවාහන සේවා සැපයීම ද සංචාරකයින් වැඩියෙන් ආකර්ෂණය කර ගැනීම සඳහා ඉවහල් වනු ඇත. තවද, සංචාරක ක්ෂේත්‍රය හා සම්බන්ධ රාජ්‍ය ආයතන ද පෞද්ගලික අංශය ද ඇතුළුව සංචාරක කර්මාන්තයේ නියුතු සියලු පාර්ශ්වකරුවන් අධීක්ෂණය කිරීම සඳහා ඉහළ මට්ටමේ රාජ්‍ය ව්‍යුහයක් අවශ්‍ය වන අතර, එමගින් වඩා සහසම්බන්ධතාවකින් යුතුව ඉහළ මට්ටමේ ක්‍රමෝපාය ක්‍රියාවට නැංවීමට ඉඩ සැලසෙනු ඇත. මීට අමතරව, වඩා හොඳ මාර්ග ආරක්ෂාව සහ අනුග්‍රහය, නිසි අපද්‍රව්‍ය බැහැර කිරීමේ පුරුදු සහ සංචාරකයින් කෙරෙහි වූ වැඩිදියුණු ආකල්ප සහ සංස්කෘතිකමය වටහා ගැනීම් ආදී වූ සමාජීය පරිවර්තන සංචාරක කර්මාන්තයේ තිරසාරභාවයට මෙන්ම සමස්ත සමාජයේම වර්ධනය කෙරෙහි ද වක්‍රව දායක වනු ඇත.

සංචාරක කර්මාන්තයේ පවතින අභියෝග ජය ගැනීම සහ නව සංවර්ධනයන් ආරම්භ කිරීම සඳහා අවශ්‍ය යෝජනා ගණනාවක් 2016 රජයේ අයවැය මගින් හඳුනා ගෙන තිබේ. ඊට අමතරව, රජයේ නව බස්නාහිර පළාත් මහානගර ප්‍රධාන සැලැස්ම මගින් බස්නාහිර පළාත ඉතා ඉහළ සංචාරක ගමනාන්තයක් බවට වැඩිදියුණු කිරීම සහ 2035 වසර වනවිට සංචාරක පැමිණීම් මිලියන 4.5 ක් දක්වා ඉහළ නංවා ගැනීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ඇතුලත් දිගුකාලීන සැලැස්මක් (Megapolis Master Plan) හඳුන්වා දී තිබේ. ගුවන් හා නාවික වෙළඳ කේන්ද්‍රස්ථාන, මධ්‍යම ව්‍යාපාරික දිස්ත්‍රික්ක, කාර්මික හා සංචාරක නගර, විද්‍යා හා තාක්ෂණ නගර, පාරිසරික ජනාවාස හා වැව්ලි නගර සහ බහු මාදිලි ප්‍රවාහන කේන්ද්‍රස්ථාන වැනි සංකල්පීය ව්‍යාපෘති ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තයට ඍජු හා වක්‍ර ප්‍රතිලාභ ලැබෙන ව්‍යාපෘති අතර වේ. මෙම නව උපායමාර්ග හා යෝජිත ක්‍රියාමාර්ග සංචාරක කර්මාන්තය මුහුණ දී ඇති ගැටලු ජය ගැනීමට සහ සෞභාග්‍යයේ මාවත කරා සංචාරක කර්මාන්තය රැගෙන යමින් ඉදිරි දශකය තුළ තිරසාර සංවර්ධනයක් ළඟාකර ගැනීම සඳහා උපකාරී වනු ඇත.

මූලාශ්‍ර:

From Island to Continent: Western Region Megapolis Master Plan, මහානගර සහ බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය

Travel and Tourism; Economic Impact 2015 Sri Lanka, World Travel and Tourism Council, (2015)

World Travel and Tourism Council, https://www.wttc.org

Sri Lanka Tourism Development Authority, https://www.sltda.gov.lk

විවිධ පුවත්පත් ලිපි

(උපුටා ගැනීම: ශ්‍රී ලංකා මහ බැංකු වාර්ෂික වාර්තාව - 2015)

# ශ්‍රී ලංකාවේ උසස් අධ්‍යාපනය ලබා දීම සඳහා රාජ්‍ය නොවන අංශයේ සහභාගිත්වය

"අධ්‍යාපනය යනු ඔබට මුළු ලෝකය ම වෙනස් කිරීම සඳහා භාවිත කළ හැකි වන වඩාත් බලගතු ආයුධයකි."[1]

- නෙල්සන් මැන්ඩෙලා,
දකුණු අප්‍රිකාවේ හිටපු ජනාධිපති හා
1993 නොබෙල් සාම ත්‍යාග සම්මානලාභී.

**පසුබිම**

වර්තමානයේ දැනුම මත පදනම් වන ගෝලීය ආර්ථිකයේ, වෙනස් වන ඉල්ලුමට හා යථාර්තයන්ට මුහුණදීම සඳහා පර්යේෂණ සහ නව සොයාගැනීම්වල උන්නතිය විදහා දක්වන ගවේෂණ හැකියාවන්ගෙන් යුක්ත නව දැනුම, උසස් අධ්‍යාපනය උදෙසා ඉතා ඉහළ හා වැදගත් කාර්යභාරයක් ඉටු කරයි. දැනුම, තාක්ෂණික දියුණුව සහ ඵලදායීතා වර්ධනය ආර්ථික වර්ධනයේ ප්‍රධාන මූලයන් වන පරිසරයක මානව අවශ්‍යතා, තාක්ෂණය සහ ගෝලීයකරණය මෙන්ම ප්‍රජා විද්‍යාත්මක වෙනස්කම් මධ්‍යයේ උසස් අධ්‍යාපනය තිරසාර ආර්ථික වර්ධනයක් සහ සෞභාග්‍යයක් පවත්වා ගැනීම සඳහා ඵලදායීතා වර්ධනය සහ නවෝත්පාදන ප්‍රමුඛතාවක් ලෙස මනාව හඳුනා ගෙන ඇත.

ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් ද ගත් කළ රාජ්‍ය හා රාජ්‍ය නොවන දෙඅංශයේම විශ්වවිද්‍යාල හා වෙනත් උසස් අධ්‍යාපන ආයතන මගින් සපයනු ලබන අධ්‍යාපනය සඳහා පෙර පැවති තත්ත්වයන්ට වඩා ඉහළ ඉල්ලුමක් දැකිය හැකිය. අතිශය තරගකාරී ලෝකයේ නව අවස්ථාවන් උපරිම ලෙස යොදා ගැනීමට ජීවන තත්ත්වය වර්ධනය කිරීම සඳහා නව නිපුණතා, දැනුම හා අදහස් අවශ්‍ය වන අතර ඒ සඳහා අධ්‍යාපනයේ ඇති වැදගත්කම තවදුරටත් පිළිබිඹු වේ. රාජ්‍ය අයවැයෙහි මූල්‍ය අවකාශය සීමා සහිත වන බැවින් උසස් අධ්‍යාපනය සඳහා පවතින අවකාශය පිළිබඳ නැවත සිතා බැලීමේ අවශ්‍යතාව මෙ මගින් අවධාරණය කරයි.

පසුගිය දශක කිහිපය පුරා ශ්‍රී ලංකාවේ උසස් අධ්‍යාපනය සඳහා සුදුසුකම් ලබා සිටින සියලුම සිසුන් රාජ්‍ය විශ්වවිද්‍යාල පද්ධතියට ඇතුළත් කර ගැනීමේ දී දැඩි ධාරිතා පිළිබඳ සීමාවන්ට මුහුණ දීමට සිදු වී ඇත. 2014/2015 අධ්‍යයන වසරේ අ.පො.ස. උසස් පෙළ විභාගය සඳහා පෙනී සිටි මුළු සිසුන් 247,376 ක් අතරින් විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා සිසුන් 149,572ක් සුදුසුකම් ලැබුව ද, ධාරිතාවේ පැවති සීමාවන් හේතුවෙන් විශ්වවිද්‍යාල පද්ධතියට ඇතුළත් කෙරුණේ සියයට 17ක් එනම් සිසුන් 25,624ක් පමණි. රජය ප්‍රාථමික හා ද්විතීයික මට්ටමේ සියලු පාසල් සිසුන්ට නිදහස් අධ්‍යාපනය ලබා දුන්න ද, රාජ්‍ය විශ්වවිද්‍යාලවලට ඇතුළත් වීමට සුදුසුකම් ලැබූ සිසුන් සියලු දෙනා හෝ ඉන් සැලකිය යුතු සංඛ්‍යාවක් බඳවා ගැනීමට නොහැකි වී ඇත.

එබැවින් රාජ්‍ය විශ්වවිද්‍යාල පද්ධතිය තුළ පවතින ධාරිතා සීමාවන් හේතුවෙන් නිර්මාණය වී ඇති පරතරය තරමක් දුරට හෝ පියවීම සඳහා රාජ්‍ය නොවන අංශයේ උසස් අධ්‍යාපන ආයතන වසර ගණනාවක් තිස්සේ ක්‍රමයෙන් විකාශනය වී ඇත. මේ වන විට, ශ්‍රී ලංකාව තුළ රාජ්‍ය නොවන අංශයට අනුබද්ධ විශ්වවිද්‍යාල සහ උසස් අධ්‍යාපන ආයතන විශාල සංඛ්‍යාවක් විදේශ උපාධි හෝ ඒ හා සමාන සුදුසුකම් ලබා දීමට ඉදිරිපත් වී සිටී. ශ්‍රී ලංකාව තුළ සුදුසුකම් ලත් දක්ෂ ශ්‍රමබලකායක් බිහි කිරීම සඳහා දායක වෙමින් තොරතුරු තාක්ෂණය, කළමනාකරණය, ගිණුම්කරණය, අලෙවිකරණය, නීතිය, ව්‍යාපාර, මුදල්, විද්‍යාව, වෛද්‍ය සහ ඉංජිනේරු ඇතුළත් විවිධ ක්ෂේත්‍රවලට අදාළ පාඨමාලා රාශියක් එම ආයතන විසින් පවත්වා ගෙන යනු ලබයි. තවද, ඉගෙනීම හා

1 මූලය: http://www.un.org/en/globalissues/briefingpapers/efa/quotes.shtml

නව නිපැයුම් සඳහා කලාපීය මධ්‍යස්ථානයක් ලෙස සංවර්ධනය කිරීමට සහ උසස් අධ්‍යාපනය සඳහා ආයෝජනය කරන ගමනාන්තයක් ලෙස ශ්‍රී ලංකාව සංවර්ධනය කිරීම සඳහා රාජ්‍ය නොවන අංශයේ දායකත්වය වැදගත් වනු ඇත. මෙම සංවර්ධනයන් මගින් රට තුළ උසස් අධ්‍යාපනය සැපයීම සඳහා රාජ්‍ය නොවන අංශයේ සහභාගිත්වය දිරිමත් කිරීම සඳහා වන අවශ්‍යතාව ඉස්මතු කර පෙන්වයි.

## උසස් අධ්‍යාපනය සඳහා රාජ්‍ය නොවන අංශයේ සහභාගිත්වය නිසා ඇතිවන ප්‍රතිලාභ

රාජ්‍ය නොවන අංශය උසස් අධ්‍යාපන ආයතනවල සහභාගිත්වය වැඩි කිරීම තුළින් සැලකිය යුතු ලෙස ආර්ථික හා සමාජ ප්‍රතිලාභ උත්පාදනය වේ. වර්තමානයේ ශ්‍රී ලාංකිකයින් සැලකිය යුතු සංඛ්‍යාවක් ඉතා ඉහළ මූල්‍යමය හා මූල්‍යමය නොවන පිරිවැයක් දරමින් ඉන්දියාව, නේපාලය, බංග්ලාදේශය, මැලේසියාව වැනි අසල්වැසි රටවල් ඇතුළු සංවර්ධිත හා සංවර්ධනය වෙමින් පවතින රටවල්වල විදේශ විශ්වවිද්‍යාලවලට ඇතුළත් වේ. එබැවින්, ශ්‍රී ලංකාව තුළ උසස් අධ්‍යාපන අවස්ථා පුළුල් කිරීම තුළින් සැලකිය යුතු ලෙස අඩු පිරිවැයක් යටතේ දේශීය වශයෙන් උපාධිය හැදෑරීමේ හැකියාව ලැබෙන අතර විදේශ සංචිත ද විශාල ලෙස ඉතිරි කරගත හැකි වේ. ශ්‍රී ලංකාව තුළ රාජ්‍ය නොවන අංශයේ විශ්වවිද්‍යාල පිහිටුවීම තුළින් තරගකාරිත්වය සහ විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා ඇති ඉඩකඩ වැඩිදියුණු කිරීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මකභාවය දියුණු වේ. තවද, එමගින් විදේශ ආයෝජන මෙන්ම විශේෂයෙන්ම ආසියානු කලාපයේ විදේශීය සිසුන් ආකර්ෂණය කර ගත හැකි වනු ඇත. එමෙන්ම, අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ රාජ්‍ය නොවන අංශයේ දායකත්වය ඉහළ යෑමත් සමඟ අධ්‍යයන හා අනධ්‍යයන අංශයේ රැකියා අවස්ථා සහ තවත් බොහෝ වක්‍ර රැකියා අවස්ථා රට තුළ නිර්මාණය වේ. ලෝකයේ ඉහළ පිළිගැනීමක් ඇති රාජ්‍ය නොවන අංශයේ විශ්වවිද්‍යාල සහ විශ්වවිද්‍යාල නගර රට තුළ පිහිටුවීමට අවස්ථාව සලසා දීම, ශ්‍රී ලංකාව තුළ තරගකාරී පුහුණු ශ්‍රම බලකායක් බිහිකිරීම සඳහා දායක වේ. රාජ්‍ය නොවන අංශයේ උසස් අධ්‍යාපන ආයතන, පර්යේෂණ හා සංවර්ධන කටයුතු සහ තාක්ෂණ හුවමාරු කටයුතු සඳහා ක්‍රියාකාරී ලෙස සහභාගි වීමට හැකි වනු ඇති අතර එමගින් රටේ ආර්ථික සංවර්ධන ක්‍රියාවලියට පහසුකම් සලසයි. තොරතුරු තාක්ෂණ මෘදුකාංග සංවර්ධනය, ඉංජිනේරු, වෛද්‍ය, කළමනාකරණ, මුදල්, විද්‍යා හා තාක්ෂණ ආදියෙන් සමන්විත දැනුම පදනම් කරගත් සේවා අංශය ශ්‍රී ලංකාවේ ප්‍රධාන අංශයක් ලෙස වර්ධනය වීමේ හැකියාවක් ඇති අතර, වර්තමානයේ දී අධ්‍යාපන අවස්ථා තරමක් දුරට සීමිත වී ඇත.

ශ්‍රී ලංකාවේ රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන ආයතන සඳහා බඳවා ගනු ලබන විදේශීය සිසුන් සංඛ්‍යාව සතුටුදායක ලෙස වැඩි වන බව නිරීක්ෂණය වී ඇත. ඒ අනුව උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශය විසින් උසස් අධ්‍යාපනය හැදෑරීම සඳහා ශ්‍රී ලංකාවට පැමිණෙන විදේශීය සිසුන් සඳහා ඇතුළුවීම්/නේවාසික වීසා ලබා දීමට නිර්දේශ කර ඇත. උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශයේ රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන අංශය විසින් 2015 වසර තුළ දී වීසා අයදුම්පත් 224කට ආසන්න ප්‍රමාණයක් සකසා ඇත.

**රාජ්‍ය නොවන ආයතනවල උපාධි පිරිනැමීමේ පාඨමාලා සඳහා ඇතුළත් කර ගත් සිසුන්**

| උපාධි වර්ගය | දේශීය පාඨමාලා යටතේ උපාධිය හදාරන සිසුන් | | දේශීය හා විදේශීය අනුබද්ධ විශ්වවිද්‍යාලවල පාඨමාලා හදාරන සිසුන් | |
|---|---|---|---|---|
| | 2014 අවසන් වන විට බඳවා ගෙන සිටි මුළු සිසුන් | 2015 වසර තුළ බඳවා ගත් සිසුන් | 2014 අවසන් වන විට බඳවා ගෙන සිටි මුළු සිසුන් | 2015 වසර තුළ බඳවා ගත් සිසුන් |
| කලා හා සෞන්දර්යය අධ්‍යයනය | 902 | 286 | 645 | 412 |
| වාණිජ්‍ය හා කළමනාකරණ අධ්‍යයනය | 2,778 | 843 | 46,067 | 5,577 |
| නීතිය | - | - | 27 | 28 |
| විද්‍යාව | 106 | 87 | 41 | 45 |
| ඉංජිනේරු | 648 | 410 | 471 | 121 |
| තොරතුරු තාක්ෂණය | 3,459 | 1,345 | 2,478 | 1,328 |
| වෙනත් | 234 | 33 | 2,232 | 1,032 |
| එම්.බී.බී.එස්. (වෛද්‍ය) | 765 | 70 | - | - |
| මුළු ශිෂ්‍ය බඳවා ගැනීම් | 8,892 | 3,074 | 51,961 | 8,543 |

මූලය: උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශය

## උපාධි ප්‍රදානය කරන ශ්‍රී ලංකාවේ රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන ආයතන

### (අ) උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශය යටතේ ලියාපදිංචි වී ඇති රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන ආයතන

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 25 A වගන්තිය සහ 2013 අංක 1 දරන විශේෂ අධිකාරී රීති අනුව, රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන

ආයතන සඳහා උපාධි ප්‍රදානය කිරීමේ තත්ත්වය ලබා දීමේ අධිකාරි බලය උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශයේ ගරු අමාත්‍යතුමා වෙත පැවරී ඇත. ඒ අනුව, 2015 වසර අවසානය වන විට රාජ්‍ය නොවන අංශයේ උසස් අධ්‍යාපන ආයතන 16ක් “උපාධි ප්‍රදානය කරන ආයතන” ලෙස පිළිගෙන ඇති අතර, එමගින් විවිධ අධ්‍යයන විෂයන්ගෙන් සමන්විත උපාධි පාඨමාලා 64ක් යටතේ උපාධි ලබා දෙනු ලැබේ. එම ආයතනවල කාර්යසාධනය සංඛ්‍යා සටහන 1 යටතේ දක්වා ඇත.

මෙම ආයතන 16 මගින් රැස්කළ දත්තවලට අනුව, 2014 වසර අවසන් වන විට විවිධ පාඨමාලා සඳහා සිසුන් 8,892 ක් බඳවා ගෙන සිටි අතර තවත් සිසුන් 3,074 ක් ශ්‍රී ලංකාව තුළ ලියාපදිංචි මෙම රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන ආයතන සඳහා අලුතින් ඇතුළත් කර ගෙන ඇත. තවද, පූර්ණකාලීන හා අර්ධකාලීන පාඨමාලාවල ලියාපදිංචි වී සිටි සිසුන් 2,035 ක් 2015 වසර තුළ දී උපාධිය ලබා ගෙන ඇති අතර, එයින් බහුතරයක් වාණිජ්‍ය සහ කළමනාකරණය, තොරතුරු තාක්ෂණය හා සම්බන්ධ පාඨමාලා හදාරනු ලැබූ සිසුන් වේ.

### (ආ) උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශය යටතේ ලියාපදිංචි වී නොමැති රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන ආයතන

උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශය යටතේ ලියාපදිංචි නොවූ රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන ආයතන 26කින් යුත් නියැදියක් සඳහා සිදු කළ සමීක්ෂණයකින්[5] ආයතන 16ක් පමණක් ප්‍රතිචාර දක්වන ලදී. ඒ අනුව, ලියාපදිංචි නොවූ උසස් අධ්‍යාපන ආයතන මගින් ශ්‍රී ලංකාවේ උසස් අධ්‍යාපනය සඳහා සැලකිය යුතු දායකත්වයක් ලබා දී ඇති අතර, 2014 සහ 2015 වසරවල දී පිළිවෙලින් සිසුන් 4,260ක් හා 4,518ක් උපාධි පාඨමාලා සඳහා ඇතුළත් කර ගන්නා ලදී. සිසුන් පූර්ණකාලීන හා අර්ධකාලීන පාඨමාලා සඳහා

**රාජ්‍ය නොවන ආයතන විසින් පවත්වනු ලබන උපාධි පාඨමාලාවල උපාධිය පිළිබඳ විස්තර**

| පාඨමාලා කාණ්ඩය | දේශීය පාඨමාලා හදාරා උපාධිය ලබාගත් සිසුන් | | දේශීය[2] හා විදේශීය අනුබද්ධ විශ්වවිද්‍යාලවල[3] පාඨමාලා හදාරා උපාදි ලබාගත් සිසුන් | |
|---|---|---|---|---|
| | 2014 අවසන් වන විට මුළු උපාධිධාරීන්[4] | 2015 වසර තුළ උපාධිය ලැබූ උපාධිධාරීන් | 2014 වසර අවසන් වන විට මුළු උපාධිධාරීන් | 2015 වසර තුළ උපාධිය ලැබූ උපාධිධාරීන් |
| සහතික පත්‍ර | - | - | 38 | 35 |
| ඩිප්ලෝමා/උසස් ජාතික ඩිප්ලෝමා | - | - | 6,094 | 1,634 |
| ප්‍රථම උපාධිය | 6,626 | 1,476 | 3,328 | 1,026 |
| පශ්චාත් උපාධි ඩිප්ලෝමා | 742 | 149 | - | - |
| පශ්චාත් උපාධි | 31 | 410 | 270 | 17 |
| ආචාර්ය උපාධි | - | - | - | - |
| **උපාධිය ලැබූ මුළු සිසුන් සංඛ්‍යාව** | 7,399 | 2,035 | 9,730 | 2,712 |

මූලය: උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශය

2. දේශිය පාඨමාලා: සහතික පත්‍ර, ඩිප්ලෝමා හා උසස් ජාතික ඩිප්ලෝමා පාඨමාලා මෙයට ඇතුළත් වේ.
3. විදේශීය විශ්වවිද්‍යාල අනුබද්ධ පාඨමාලා: ප්‍රථම උපාධි හා පශ්චාත් උපාධි මට්ටම් පාඨමාලා මෙයට ඇතුළත් වේ.
4. විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගැනීමෙන් අනතුරුව උපාධිය ලබාගත් මුළු සිසුන් සංඛ්‍යාව මෙමගින් නිරූපනය වේ.

**උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශය යටතේ ලියාපදිංචි නොවූ රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන ආයතනවලට බඳවා ගත් සිසුන් හා උපාධිය ලබාගත් සිසුන්**

| විස්තරය | 2014 | 2015 |
|---|---|---|
| උපාධි වර්ගය | | |
| ප්‍රථම උපාධිය | 1,619 | 1,598 |
| පශ්චාත් උපාධිය | 603 | 807 |
| **මුළු උපාධිධාරීන් සංඛ්‍යාව** | **2,222** | **2,405** |
| ඇතුළත් වීමේ සුදුසුකම් | | |
| අ.පො.ස (උ/පෙළ) | 2,890 | 2,986 |
| අ.පො.ස (සා/පෙළ) | 166 | 152 |
| වෙනත් | 1,204 | 1,380 |
| **මුළු ශිෂ්‍ය බඳවාගැනීම්** | **4,260** | **4,518** |
| උපාධි පාඨමාලාව (ප්‍රථම උපාධිය) | | |
| කලා හා සෞන්දර්ය අධ්‍යයනය | 126 | 102 |
| වාණිජ්‍ය හා කළමනාකරණ අධ්‍යයනය | 629 | 573 |
| නීතිය | 141 | 147 |
| විද්‍යාව | 107 | - |
| ඉංජිනේරු විද්‍යාව | 383 | 470 |
| තොරතුරු තාක්ෂණය | 233 | 209 |
| ප්‍රථම උපාධි පාඨමාලා හැදෑරූ මුළු උපාධිධාරීන් සංඛ්‍යාව | 1,619 | 1,598 |
| උපාධි පාඨමාලාව (පශ්චාත් උපාධිය) | | |
| වාණිජ්‍ය හා කළමනාකරණ අධ්‍යයනය | 546 | 700 |
| තොරතුරු තාක්ෂණය | 33 | 55 |
| නීතිය | 24 | 52 |
| පශ්චාත් උපාධි පාඨමාලා හැදෑරූ මුළු උපාධිධාරීන් සංඛ්‍යාව | 603 | 807 |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව විසින් රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන ආයතන සඳහා පවත්වන ලද සමීක්ෂණය - 2016

මෙම ආයතනවල ලියාපදිංචි වී ඇති අතර 2014 සහ 2015 වසරවල දී පිළිවෙළින් සිසුන් 2,222ක් හා 2,405ක් උපාධිය ලබා ගෙන ඇත. මෙම උපාධි පාඨමාලාවලින් බහුතරයක් සඳහා අ.පො.ස. (උ/පෙළ) ප්‍රතිඵල මත ඇතුළත් වීමේ වරම් ලබා දී ඇති අතර, 2014 සහ 2015 වසර දෙක තුළ දීම උපාධි පාඨමාලා හැදෑරූ සිසුන්ගෙන් සියයට 50කට වඩා වැඩි ප්‍රමාණයක් වාණිජ්‍ය හා කළමනාකරණ පාඨමාලා හැදෑරූ සිසුන් වේ.

## ඉදිරි දැක්ම

ගෝලීය දැනුම් ආර්ථිකයේ ප්‍රතිලාභ අත්කර ගැනීම සඳහා ශ්‍රී ලංකාව අපේක්ෂා කරන පසුබිමක රටට අවශ්‍ය මානව ප්‍රාග්ධනය ශක්තිමත් කිරීමේ කාර්යයේ දී උසස් අධ්‍යාපන ක්ෂේත්‍රයට ප්‍රධාන කාර්යභාරයක් පැවරී ඇත. රාජ්‍ය විශ්වවිද්‍යාලවල ධාරිතා සීමාවන් පැවතීම සහ රජයේ මූල්‍ය සංරෝධක පැවතීම හේතුවෙන් රටේ උසස් අධ්‍යාපන ක්ෂේත්‍රයට ක්‍රියාකාරී දායකත්වයක් සැපයීම සඳහා විදේශ විශ්වවිද්‍යාල සහ වෘත්තීමය ආයතන ඇතුළු රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන ආයතනවලට පහසුකම් සලසා දීම සහ ඒවා දිරිමත් කිරීම ඉතා වැදගත් වේ. රට තුළ රාජ්‍ය නොවන විශ්වවිද්‍යාල පිහිටුවීමේ ප්‍රගතිය ඉතා අවම වුවත් පසුගිය වසර 15කට අධික කාලයක් තිස්සේ ශ්‍රී ලංකා රජයේ වැඩි මැදිහත්වීමකින් තොරව, ප්‍රධාන වශයෙන් ඉල්ලුම පාදක කරගත් වෙළඳපොළ බලවේග[6] හරහා උසස් අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ රාජ්‍ය නොවන සහභාගිත්වය විශිෂ්ට අන්දමින් ඉහළ ගොස් ඇත. මෙම වර්ධනයන් සමග සහ මෙම අංශයේ වෙනස් වන ස්වභාවය මත රාජ්‍ය නොවන අංශයේ තෘතීය අධ්‍යාපනය සැපයීම දිරිමත් කිරීම සඳහා දැනට පවතින දැඩි රෙගුලාසි ලිහිල් විය යුතුය. උසස් අධ්‍යාපනයේ ප්‍රමිතිය, ගුණාත්මකභාවය සහ වගකීමට බැඳී සිටීම තහවුරු කිරීම සඳහා දීර්ඝකාලීන අවශ්‍යතාවක්ව පැවති ස්වාධීන ජාතික තත්ත්ව සහතික සහ ප්‍රතීතන කවුන්සලයක් (National Quality Assurance and Accreditation Council - NQAAC) ස්ථාපිත කිරීම වැදගත් වේ. ස්වාධීන ජාතික තත්ත්ව සහතික සහ ප්‍රතීතන කවුන්සලය, රාජ්‍ය හා රාජ්‍ය නොවන දෙඅංශයේම උසස් අධ්‍යාපන ආයතන තුළ ශක්තිමත් හා පුළුල් තත්ත්ව සහතික කරන හා ප්‍රතීතන පද්ධතියක් ස්ථාපිත කරනු ඇති අතර රට තුළ උසස් අධ්‍යාපන ආයතන පිහිටුවීම හා කළමනාකරණය කිරීමට නීති හා රෙගුලාසි හඳුන්වා දෙනු ඇත.

ඒ සමගම, රට තුළ උසස් අධ්‍යාපනය සැපයීම සඳහා රාජ්‍ය නොවන අංශයේ සහභාගිත්වය උනන්දු කරවන අතරම අවශ්‍යතාවන් ඉහළ නැංවීම සඳහා රාජ්‍ය අංශයේ උසස් අධ්‍යාපන ක්‍රමය ද ශක්තිමත් හා පුළුල් කර ගත යුතු අතර ශ්‍රම වෙළඳපොළ ඉල්ලුමේ ගුණාත්මකභාවය සහ අදාළත්වය වැඩිදියුණු කිරීම අවශ්‍ය වේ. රාජ්‍ය නොවන අංශයේ උසස් අධ්‍යාපන ආයතනවලට අඩු ආදායම්ලාභී දක්ෂ සිසුන් සඳහා ශිෂ්‍යත්ව ප්‍රදානය කළ හැකි වේ. රාජ්‍ය නොවන අංශයේ උසස් අධ්‍යාපන ආයතනවලට ගාස්තු අයකිරීම් සඳහා ඵලදායී උසස් අධ්‍යාපන වියදම් මූල්‍යන යාන්ත්‍රණයක් හඳුන්වා දීම, අඩු ආදායම්ලාභී සිසුන් සඳහා උපකාරයක් වේ.

වෘත්තීය හා කාර්මික ක්ෂේත්‍රය තුළ ද ඉහළ ගුණාත්මකභාවයෙන් යුතු රාජ්‍ය නොවන අංශයේ අධ්‍යාපන ආයතන ස්ථාපිත කිරීම වැදගත් වේ. වෘත්තීය අධ්‍යාපනය මගින් සත්කාරක සේවය, හෙද සේවය, යාන්ත්‍රික, ජලනල කාර්මික ශිල්පය, වඩු කර්මාන්තය, ඖෂධවේදය හා ප්‍රමාණාත්මක සමීක්ෂණය වැනි වෘත්තීමය ක්ෂේත්‍රවල සේවය කිරීම සඳහා සිසුන්ව සූදානම් කරනු ලබයි. එබැවින්, දේශීය හා විදේශීය වශයෙන් වර්ධනය වන වෙළෙඳපොළ හා කාර්මික අවශ්‍යතා සපුරාලීම සඳහා සුදුසුකම් ලත් දක්ෂ ශ්‍රම බලකායක් නිර්මාණය කිරීමට මෙම ආයතනවලට හැකියාව පවතී.

මූලාශ්‍ර:

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය

අධ්‍යාපන අමාත්‍යාංශය

උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශය

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසම


රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන ආයතන

(උපුටා ගැනීම: ශ්‍රී ලංකා මහ බැංකු වාර්ෂික වාර්තාව - 2015)

# ජනගහනය වියපත් වීම :
# අභියෝග හා ඉදිරි දැක්ම


ශ්‍රී ලංකාවේ ජනගහනය, දකුණු ආසියාවේ වියපත්ම ජනගහනය වන අතර, ලොව වේගයෙන්ම වියපත් වන ජනගහන අතරින් එකක් ද වේ (එක්සත් ජාතීන්ගේ සංවිධානය, 2015). 2015 වසරේ දී ශ්‍රී ලංකාවේ ජනගහනය මිලියන 20.96ක් දක්වා ළඟා වූ අතර, එයින් සියයට 13.9ක් වයස අවුරුදු 60 ට වැඩි බවට ඇස්තමේන්තු කර ඇත. මෙම අගය වසර 2050 හා වසර 2100 වන විට, පිළිවෙළින් සියයට 28.6ක් හා සියයට 40.0ක් දක්වා ශීඝ්‍ර ලෙස ඉහළ යනු ඇතැයි අපේක්ෂා කෙරේ (එක්සත් ජාතීන්ගේ සංවිධානය, 2015). සුභසාධනය, අධ්‍යාපනය හා සෞඛ්‍ය සඳහා දශක කිහිපයක් පුරා කරන ලද

**තෝරාගත් රටවල/කලාපවල ජනගහනයේ මධ්‍යන්‍ය වයස**




මූලය: එක්සත් ජාතීන්ගේ සංවිධානය (2015)

**ශ්‍රී ලංකාවේ ජනගහනයේ ව්‍යාප්තිය**




මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව හා De Silva (2015)


ආයෝජන හේතුවෙන් ආයු අපේක්ෂාව ඉහළ යාම සහ ශීඝ්‍ර ලෙස පහළ යන සාඵල්‍යතා අනුපාතය යන ශ්‍රී ලංකාවට අනන්‍ය ජනවිකාශ ලක්ෂණ හේතුවෙන් මෙරට, දකුණු ආසියානු කලාපයේ විශේෂ රටක් ලෙස සැලකේ. වයස් ව්‍යුහයේ ඇති වී තිබෙන පරිවර්තන හේතුවෙන් මේ වන විට ජනවිකාශ ප්‍රතිලාභයක් නිර්මාණය වී ඇති අතර, එහිදී වැඩකරන වයසේ (අවුරුදු 15 - 64) පසුවන ජනගහනයේ ප්‍රතිශතය යැපෙන්නන්ගේ (අවුරුදු 15 ට අඩු හා අවුරුදු 64 ට වැඩි) ප්‍රතිශතයට වඩා සැලකිය යුතු ඉහළ අගයක් ගන්නා අතර, එය ආර්ථික වර්ධනය සඳහා හිතකර වේ. කෙසේ වෙතත්, ජනගහනය ශීඝ්‍රයෙන් වියපත් වීම හේතුවෙන් මෙම තත්ත්වය වැඩි කාලයක් ගතවීමට පෙර වියැකී යනු ඇත.[1]


## ජනගහනය වියපත් වීම බහුමාන අභියෝගයන්ට හේතු වේ


සංවර්ධිත රටවල මෙන් නොව, ජනවිකාශ සංක්‍රාන්තිය හේතුවෙන් පැන නගින බහුමාන අභියෝගවලට ශ්‍රී ලංකාව මුහුණ දෙන්නේ ඒක පුද්ගල දළ දේශීය නිෂ්පාදිතය සාපේක්ෂ වශයෙන් අඩු මට්ටමක පවතින අතර වැඩිහිටියන් සඳහා වන සුභසාධන පහසුකම් නොදියුණු මට්ටමක පවතින පසුබිමක් යටතේය. වොඩොපිවෙක් හා අරුණතිලක (Vodopivec and Arunatilake), (2008) වාර්තා කරන පරිදි ශ්‍රී ලංකාවේ වැඩිහිටි ජනගහනයෙන් දහයෙන් කොටසකට පමණක් සිය ප්‍රධාන ආදායම් මාර්ගය ලෙස විශ්‍රාම වැටුප් හිමිවන අතර, එය 2015 වසරේ දී ද ආසන්න වශයෙන් එම මට්ටමේ ම පවතී. එබැවින්, වැඩිහිටියන් සඳහා පවුලෙන් ලැබෙන උපකාර ඉදිරි දශක කිහිපය තුළ දී ද තවදුරටත් වැදගත් වනු ඇත. කෙසේ වෙතත්, ශීඝ්‍ර නාගරීකරණයත් සමඟ කුඩා පවුල් ඇතිවන බැවින් වැඩිහිටියන් සඳහා පවුලෙන් ලැබෙන උපකාර අඩුවීමේ ප්‍රවණතාවක් පවතී. ග්‍රාමීය නාගරික සංක්‍රමණය හා ශ්‍රම බලකායේ ස්ත්‍රී

1 වැඩකරන වයසේ ජනගහනය අවුරුදු 65 දක්වා වෙතැයි සැලකුවහොත් 1991 - 2031 අතර කාලය තුළ ජනවිකාශ ප්‍රතිලාභ පවතිනු ඇතැයි අපේක්ෂා කරන අතර, විශ්‍රාම යාමේ අනිවාර්ය වයස් සීමාව අවුරුදු 60 යැයි සැලකුවහොත් එය වසර 2017 දක්වා පමණක් පවතිනු ඇත. (De Silva, 2015)

## 1981, 2012 හා 2041 වසරවල ශ්‍රී ලංකාවේ ජනගහනයේ වයස් - ස්ත්‍රී පුරුෂ ව්‍යුහය




මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව, De Silva (2015)

සහභාගිත්වය ඉහළ යාම මගින් ග්‍රාමීය ප්‍රදේශවල පවා වැඩිහිටියන්ට උපකාර කිරීම තවදුරටත් ගැටලුකාරී වේ. මෙයට අමතරව ඉතුරුම් අඩුවීම මෙන්ම විශ්‍රාම වැටුප් හා සෞඛ්‍ය වියදම් ඉහළ යාම හේතුවෙන්, අවසානයේ දී රජයේ අයවැය මත අනිවාර්ය පීඩනයක් ඇති වන අතර, මෙම තත්ත්වයන් හේතුවෙන් ඇතිවන බලපෑම් බරපතල ගැටළු ලෙස අඛණ්ඩව පවතී. වැඩකරන වයසේ පසුවන සාමාන්‍ය පුද්ගලයෙකුට සාපේක්ෂව වැඩිහිටි පුද්ගලයෙකු විසින් කරන ඉතුරුම් ප්‍රමාණය අඩු බැවින්, එය ප්‍රාග්ධන සම්පාදනය මත සැලකිය යුතු ඍණාත්මක බලපෑමක් ඇති කරනු ඇත. වියපත් වීම හේතුවෙන් වැඩකරන වයසේ පසුවන ජනගහනයේ ප්‍රතිශතය අඩුවීම, ආර්ථික වර්ධනය අඩාල කරමින් ශ්‍රම බලකාය හීන කිරීමට හේතු විය හැකිය. එමගින්, ආදායම් බදු පදනම මෙන්ම ගෘහ ඒකක ආදායම ද අඩු විය හැකි අතර, ඒ හේතුවෙන් රජයේ බදු ආදායම තවදුරටත් පහළ යා හැකිය.

විවිධ වයස් කාණ්ඩවල පුද්ගලයන්ට විවිධ අවශ්‍යතා හා ඵලදායී හැකියාවන් ඇති බැවින් ජනගහනය වියපත් වීමේ දී රටේ ආර්ථික ලක්ෂණ ද වෙනස් වීමේ හැකියාවක් පවතී. ආයු අපේක්ෂාව ඉහළ යාම හා ජනගහනය වියපත් වීමත් සමඟ, විශ්‍රාම ප්‍රතිපත්තිය, විශ්‍රාම වැටුප් හා සෞඛ්‍ය සේවා මූල්‍යනය, ශ්‍රමය හා ප්‍රාග්ධන වෙළෙඳපොළවල කාර්යක්ෂමතාව සහ කලාපීය හා ගෝලීය ආර්ථික පද්ධතිවල ව්‍යුහය යනාදිය සංශෝධනය විය හැකිය. මෙම පරිවර්තනවල විශාලත්වය තරුණ පිරිස්වල අවශ්‍යතාවන් හා රුචි අරුචිකම්වලට සාපේක්ෂව වෙනස් අවශ්‍යතාවන් සහිත වයස්ගත පුද්ගලයන්ගේ ඡන්ද බලය සහ අනෙකුත් දේශපාලනික ක්‍රියා මත රඳා පවතී. අවුරුදු 60ට වැඩි පුද්ගලයන් අඩුවෙන් වැඩ කිරීමේ හා ඉතිරි කිරීමේ නැඹුරුවක් ඇති අතර, ඔවුන් විසින් ආර්ථිකය වෙත අඩු ශ්‍රම දායකත්වයක් හා සුළු ප්‍රාග්ධනයක් ලබා දෙනු ඇතැයි මෙයින් පිළිබිඹු වේ. ඔවුන්ට සෞඛ්‍ය සේවාවන් වැඩියෙන් අවශ්‍ය අතර, ඔවුන්ගේ ආදායමෙන් වැඩි කොටසක් සමාජ විශ්‍රාම වැටුප් මත තීරණය වේ. අවුරුදු 80 හා ඊට වැඩි ජනතාවට විශේෂ අවශ්‍යතා ඇති අතර, ඔවුන්ගේ සෞඛ්‍යය පිරිහීමත් සමඟ ඔවුන්ට පූර්ණකාලීනව සැලකීමේ අවශ්‍යතාව ඉහළ යාමේ ප්‍රවණතාවක් පවතී. බොහෝ අවස්ථාවල දී, වැඩි ආයුකාලයක් සහිත පුද්ගලයන්ගේ පෞද්ගලික ඉතුරුම් ශීඝ්‍රයෙන් නැති වී යාමේ හැකියාවක් ඇති බැවින් මූල්‍යමය සහාය ලබා දීමේ අවශ්‍යතාව ද ඉහළ යයි. කෙසේ වෙතත්, අවුරුදු 60, 70 වයස්වලට එළඹෙන පුද්ගයන් සිය පෙර පරම්පරාවන්ට සාපේක්ෂව සෞඛ්‍ය

සම්පන්න නම්, සෞඛ්‍ය සේවා සඳහා වන ඉල්ලුම වඩා තීව්‍ර නොවනු ඇති අතර, අපේක්ෂිත වයසට වඩා වැඩියෙන් වැඩ කිරීමට හා ආර්ථිකයට දායකත්වය සැපයීමට බොහෝ දෙනෙකුට හැකිවනු ඇත.

ඉදිකිරීම්, කෘෂිකර්මාන්තය, සෞඛ්‍ය හා හෝටල්/සංචාරක ක්ෂේත්‍රය ඇතුළු අංශ කිහිපයක ශ්‍රම හිඟයකට ශ්‍රී ලංකාව දැනටමත් මුහුණ පාමින් සිටී. ශ්‍රමය සංක්‍රමණය වීමට අතිරේකව ජනගහනය වියපත් වීම ද ශ්‍රම හිඟය සඳහා යම් දායකත්වයක් සපයන අතර, මෙම ප්‍රවණතාව ඉදිරි දශක කිහිපය තුළ දී වඩාත් හොඳින් දැකගත හැකිවනු ඇත. අධ්‍යාපනය හා ආදායම් මට්ටම් ඉහළ යාමත් සමඟ, සාපේක්ෂව ඉහළ වැටුප් හා පිළිගැනීමක් පැවතීම හේතුවෙන් මෙරට තරුණ පිරිස් සුදු කරපටි රැකියා වෙත යොමුවීමේ නැඹුරුවක් ඇත. එහි ප්‍රතිඵලයක් වශයෙන්, විදේශීය සංක්‍රමණික ශ්‍රමිකයින් කෘෂිකාර්මික කටයුතු සමහරක හා ඉදිකිරීම් ක්ෂේත්‍රයේ කටයුතුවල යෙදී සිටින බව දැකිය හැකිය. එබැවින්, ජනගහනයේ සිදුවන වෙනස්කම්, නව පරම්පරාවේ අභිලාෂයන්, ශ්‍රම සංක්‍රමණය, රාජ්‍ය මූල්‍ය ගැටළු හා දේශීය අවශ්‍යතා වැනි කරුණු සැලකිල්ලට ගෙන සවිස්තරාත්මක ශ්‍රම වෙළෙඳපොළ ප්‍රතිපත්තියක් සකස් කර ක්‍රියාවට නැංවීමේ අවශ්‍යතාවක් පවතී.

තවද, පුරුෂයන්ට සාපේක්ෂව ස්ත්‍රීන්ගේ ආයු අපේක්ෂාව ඉහළ යාම හේතුවෙන්, ශ්‍රී ලංකාවේ වියපත්වන ජනගහනයෙන් කාන්තා ප්‍රතිශතය ක්‍රමයෙන් ඉහළ යන බව නිරීක්ෂණය කර ඇත. (De Silva, 2015). මේ වන විට, ස්ත්‍රී ආයු අපේක්ෂාව, පුරුෂ ආයු අපේක්ෂාව ඉක්මවා වසර 6 ක පමණ පුළුල් සීමාවක පැවතිය ද, වියපත් ස්ත්‍රී ජනගහනයෙන් වැඩි කොටසක් එම කාණ්ඩයේ පුරුෂයන්ට සාපේක්ෂව ආර්ථිකමය වශයෙන් සක්‍රිය නොවේ. ඒ අනුව, මෙම අවදානම් වයසේ පසුවන ස්ත්‍රී යැපෙන්නන් ඉලක්ක කරගත් ඉදිරිගාමී ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග ගැනීම ද අවශ්‍ය වේ.

### ජනගහනය වියපත්වීමට ප්‍රතිචාර ලෙස සිදුවන චර්යා රටා සැකසීම් හා ඉදිරි දැක්ම

අඩු සාඵල්‍යතාව හා ඉහළ ආයු අපේක්ෂාවට ප්‍රතිචාර ලෙස විවිධ මානයන්ට අනුකූලව පුද්ගල චර්යා රටා වෙනස් විය හැකි බව පර්යේෂණ සොයාගැනීම් මගින් පෙන්වා දෙයි (Bloom et al., 2010). පළමුව, ඉහළ ආයු අපේක්ෂාවෙන් පිළිබිඹු වන පරිදි වඩා යහපත් සෞඛ්‍ය තත්ත්වය හේතුවෙන් වැඩිහිටි සේවකයන් කලින් විශ්‍රාම යාමෙන් තොරව වැඩි කාලයක් සේවය කිරීමට නැඹුරු වේ. දෙවනුව, පුද්ගලයන් වැඩි කාලයක් සේවය කිරීමට අකමැති වුව ද, ආයු අපේක්ෂාව ඉහළ යාම නිසා වියපත් කාලයේ දී ප්‍රයෝජනයට ගැනීම සඳහා වැඩ කරන කාලය තුළ දී වැඩි වශයෙන් ඉතිරි කිරීමට පොළඹවනු ලබයි. තෙවනුව, කුඩා පවුල් මගින් පිළිබිඹු වන පරිදි අඩු සාඵල්‍යතාව හේතුවෙන් වැඩි ස්ත්‍රීන් පිරිසකට ශ්‍රම බලකායට එක්වීමට අවස්ථාව සලසා දෙයි. සිව්වනුව, දෙමව්පියන් හා බඳු ගෙවන්නන්ට අඩු දරුවන් සංඛ්‍යාවක් සඳහා ආයෝජනය කිරීමට හැකි වීම මගින් පාසල්වලට ඇතුළත් වීම හා අධ්‍යාපනික ප්‍රතිඵල ඉහළ යනු ඇති අතර, එමගින් ජනගහන ව්‍යුහයේ සිදුවන වෙනස්කම් තුළින් මානව ප්‍රාග්ධන සැකැස්ම ඉහළ නැංවීමට හැකිය. පස්වනුව, වැඩිහිටියන්ට ව්‍යාපාර කටයුතුවල යෙදීමට අවස්ථාව ලබා දීම මගින් වයස් ව්‍යුහයේ සිදුවන වෙනස්කම්වලට හැඩගැසීමට සමාජයට අවස්ථාව සැලසේ. පසුගිය පරම්පරාවලට සාපේක්ෂව වර්තමාන වැඩිහිටි පරම්පරාව සෞඛ්‍ය සම්පන්න බැවින් ඔවුන්ට ඵලදායී ලෙස වැඩි කාලයක් සේවය කිරීමට හැකිය. තවද, වැඩිහිටියන්ට අඛණ්ඩව සේවය කිරීමට දිරිමත් කරමින් ඔවුන්ගේ අත්දැකීම්වලින් ප්‍රතිලාභ ලබා ගැනීමට පෞද්ගලික අංශයට හැකියාව පවතී.

ශ්‍රී ලංකාවේ ජනගහනය වියපත් වීමේ ක්‍රියාවලිය වෙනස් කිරීමේ හැකියාව ඉතා අල්ප වන නමුත්, එය සමබර කිරීම සඳහා නිසි පියවර ක්‍රියාත්මක කළහොත් එයින් ආර්ථික වර්ධනය සඳහා අහිතකර බලපෑමක් ඇති නොවනු ඇත. සමස්ත ඵලදායිතාව ඉහළ නැංවීම, විශේෂයෙන්ම, ස්ත්‍රීන් හා වැඩිහිටි සේවකයන් අතර ශ්‍රම බලකා සහභාගිත්වය ඉහළ නැංවීම සහ ශ්‍රම ගුණාත්මකභාවය ඉහළ නැංවීම ඉලක්ක කරගත් උපායමාර්ග හා ප්‍රතිපත්ති සැකසීම මෙම වාතාවරණය යටතේ පුළුල් වැදගත්කමක් දක්වයි (Vodopivec and Arunatilake, 2008). ආර්ථික වර්ධනයට දක්වන විධිමත් දායකත්වයට අමතරව, දරුවන් රැකබලා ගැනීම, නිවාසවල උපකාරක කටයුතු, අවිධිමත් වැඩ හා විශ්‍රාම වැටුප් මගින් නිවාසවලට මූල්‍යමය සහාය ලබාදීම ඇතුළු විවිධ ගෘහස්ථ කටයුතු රැසක වැඩිහිටි ජනගහනය නිරත වන අතර, දැනුම හා අත්දැකීම් බෙදාගැනීම සහ සමාජ සේවාවන් හි නිරත වීම තුළින් සමාජයට ද සේවයක් ඉටු කරයි. මේ අතර, වැඩ කිරීමේ අයිතිය, ආරක්ෂාව ලැබීමේ අයිතිය හා තෝරාගැනීමේ අයිතිය වැඩිහිටි සේවකයන්ට හිමිවන බව තහවුරු

කිරීම වැදගත් වේ. ජනගහනය වියපත් වීමට අදාළ ඇතැම් කරුණු පිළිබඳව සමහර අධ්‍යයනයන් සිදුකර තිබුණ ද, වැඩිහිටියන්ගේ අවශ්‍යතා පිළිබඳව වඩා හොඳ දැනුමක් ලබාගැනීම සඳහා ජනගහනය වයස්ගත වීම විශේෂයෙන් අරමුණු කරගත් ගැඹුරු සමීක්ෂණ හා පර්යේෂණ අධ්‍යයනයන් ශ්‍රී ලංකාවේ සිදු කිරීම ඉතා වැදගත් වේ. ඔවුන්ට රටේ ආර්ථික වර්ධනයට සක්‍රීය ලෙස දායක විය හැකි වන ක්‍රම හා විධි වඩාත් හොඳින් සොයා ගැනීමත්, සුමට ජනවිකාශ සංක්‍රාන්තියක් සහතික කිරීමටත් එමගින් හැකිවනු ඇත.

මූලාශ්‍ර :


W. Indralal De Silva (2015) *Sri Lanka, paradigm shifts in population,* Fortune Printers.


UN (2015) United Nations Department of Economic and Social Affairs/Population Division *World Population Prospects: The 2015 Revision, Key Findings and Advance Tables.*

Vodopivec M. and Arunatilake N. (2008). *The Impact of Population Aging on the Labor Market: The Case of Sri Lanka.* World Bank and IZA, Institute for Policy Studies, Colombo.

Bloom, D. E., Canning, D., & Fink, G. (2010). *Implications of population ageing for economic growth.* Oxford Review of Economic Policy, 26(4), 583-612.

Institute of Policy Studies (IPS) and United Nations Population Fund (UNFPA) (2014) *Investing in the Demographic Dividend Successes Challenges and Way Forward for Sri Lanka,* http://countryoffice.unfpa.org/srilanka/drive/223035577


(උපුටා ගැනීම: ශ්‍රී ලංකා මහ බැංකු වාර්ෂික වාර්තාව - 2015)





# දැනුම අලුත් කර ගන්න

## මුදලේ ඉතිහාසය

- ශ්‍රී ලංකා ව්‍යවහාර මුදලේ ඉතිහාසය
- විවිධ යුගවල දී භාවිත වූ කාසි හා නෝට්ටු
- ව්‍යවහාර මුදල් මණ්ඩල යුගයේ දී භාවිත කළ නෝට්ටු
- ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද සියලු ම නෝට්ටු කාණ්ඩ
- ශ්‍රී ලංකා සමරු කාසි විකිණීම
- ශ්‍රී ලංකා සමරු කාසි
- මුදල් නෝට්ටු නිෂ්පාදනය
- මුදල් නෝට්ටු වල ආරක්ෂක සලකුණු

## මහ බැංකු ප්‍රකාශන

- උසස් පෙළ, විශ්වවිද්‍යාල සිසුන්ට, විද්‍යාර්ථීන්ට සහ ප්‍රතිපත්ති සම්පාදකයන්ට
- නවතම දත්ත සහ සංඛ්‍යාන තොරතුරු
- සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවලින්

## පාසල් ළමුන් සඳහා

- ඉල්ලීම් මත පාසල් ළමුන් සඳහා විශේෂ දේශන
- ආර්ථික හා මූල්‍ය විෂයයන් අලළා ලියවුණු වටිනා පොත් සහ වාර සඟරා රැසක් විකිණීමට

**පාසල් කණ්ඩායම් වශයෙන් පැමිණීම සඳහා විමසන්න.**

**011-2477257**

ෆැක්ස් 011-2346304, ඊ-මේල්; dcommunications@cbsl.lk

**ව්‍යවහාර මුදල් අංශය**

දුරකථන : 011-2444503, 011-2477578
ඊ-මේල්: currency@cbsl.lk

**ප්‍රකාශන අංශය**

දුරකථන: 011-2444502, 011-2477418
ඊ-මේල්: dcommunications@cbsl.lk

**සඳුදා සිට සිකුරාදා තෙක්**
**පෙ.ව. 9.00 සිට ප.ව. 5.00 දක්වා**
(බැංකු නිවාඩු දිනයන්හිදී වසා තැබේ)

**සෙන්ට්‍රල් පොයින්ට් ගොඩනැගිල්ල, නො. 54, චැතම් වීදිය, කොළඹ 01**

# බැංකුවල සුරක්ෂිතභාවය සහ ශක්තිමත්භාවය තහවුරු කිරීම සඳහා හඳුන්වා දෙන ලද නව නියාමන සහ අධීක්ෂණ ක්‍රමවේද

## 1. හැඳින්වීම

බැංකු නියාමන අධිකාරීන් නියාමනය සහ අධීක්ෂණය හරහා බැංකුවල සහ බැංකු පද්ධතියෙහි සුරක්ෂිතභාවය සහ ශක්තිමත්භාවය ප්‍රවර්ධනය කිරීමට අපේක්ෂා කරනු ලබයි. ආර්ථික වශයෙන් සමෘද්ධිමත් කාලපරිච්ඡේදයන්හිදී අවදානම් සහ සංකේන්ද්‍රණයවීම් ගොඩනැගීමත්, ආර්ථික වර්ධනය අඩාල වන කාලපරිච්ඡේදයන්හි දී එවැනි ගොඩනැගීම්වලින් පසුකාලීනව පැන නැගිය හැකි ප්‍රතිඵලත් සැලකිල්ලට ගැනීමේ අවශ්‍යතාව, ලෝක මූල්‍ය අර්බුදයෙන් සහ පසුකාලීන යුරෝපීය අර්බුදයෙන් පසුව වඩාත් අවධාරණය කෙරිණි. මූල්‍ය ආයතන, මූල්‍ය වෙළෙඳපොළවල් සහ මූර්ත ආර්ථිකය අතර ඇති අන්තර් සම්බන්ධතා හේතුවෙන් එවැනි ප්‍රතිඵලවල බලපෑම් තීව්‍ර විය. වෙළෙඳපොළ අධීක්ෂණයට හෝ සූක්ෂ්ම විචක්ෂණශීලී අධීක්ෂණයට හෝ, අධික ලෙස අවදානම් භාරගැනීම හෝ මූල්‍ය ආයතන සහ වෙළෙඳපොළ ක්‍රියාකාරකම් හේතුවෙන් ඇතිවන අන්තර් සම්බන්ධතා හෝ පාලනය කිරීමට නොහැකි විය. වෙන් වෙන්ව පවතින නියාමන ව්‍යුහයන්, අන්තර්ජාතික සහ දේශීය වශයෙන් තොරතුරු හුවමාරු කර ගැනීම සම්බන්ධයෙන් පවතින නීතිමය බාධා සහ නියාමන ව්‍යුහයෙහි පවතින විෂමතා තුළින් පැන නගින ගැටළු මේ සඳහා බලපාන ලදී. නව බැංකු ව්‍යාපාර ආකෘතීන් හඳුන්වාදීමෙන් සහ තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය විශාල ලෙස භාවිතයට ගැනීම හේතුවෙන් ද නියාමන අභියෝග වර්ධනය වී ඇත.

මෙහි ප්‍රතිඵලයක් ලෙස, රටවල් වැඩි වශයෙන්, සාර්ව විචක්ෂණශීලී අධීක්ෂණය, ව්‍යාපාර ආකෘති මත පදනම් වූ අවදානම් කෙරෙහි සංවේදී සහ අනාගතවාදී නියාමනයන් සහ අධීක්ෂණ ක්‍රමවේදයන්, අර්බුදවලට සූදානම්වීම සහ නිවාරණ සැලසුම් ශක්තිමත් කිරීම පිළිබඳ ක්‍රියාමාර්ග සහ අධීක්ෂණ සහයෝගිතාව පිළිබඳ ක්‍රියාමාර්ග හඳුන්වා දෙමින් සිටී.

## 2. සූක්ෂ්ම විචක්ෂණශීලී අධීක්ෂණයෙහි සිට සාර්ව විචක්ෂණශීලී ප්‍රවේශයක් වෙත යොමුවීම

**(අ) මූල්‍ය පද්ධතියෙහි පවතින පද්ධතිමය අවදානම්වලට පිළියම් සෙවීම**

තනි තනි මූල්‍ය ආයතනවල අවදානම් සහ අනාවරණය වීම්වලට අමතරව, මූල්‍ය ආයතන, මූල්‍ය වෙළෙඳපොළවල්, මූල්‍ය යටිතල ව්‍යුහයන් සහ මූර්ත ආර්ථිකය අතර ඇති අන්තර් සම්බන්ධතා හේතුවෙන් ද මූල්‍ය පද්ධතිය තුළ අසමතුලිතතා සහ සංකේන්ද්‍රණය වීම් ගොඩනැගිය හැක. එමනිසා, අවදානම් පැතිරයාම නිසා ඇති වන බලපෑම් සහ ප්‍රතිපෝෂණ බලපෑම් සැලකිල්ලට නොගනිමින්, තනි තනි ආයතනවල අවදානම් පමණක් සැලකිල්ලට ගනු ලබන සූක්ෂ්ම විචක්ෂණශීලී ප්‍රවේශයක් නියාමනය සහ අධීක්ෂණය සඳහා යොදාගැනීම, මූල්‍ය පද්ධති ස්ථායිතාව පවත්වාගෙන යාම සඳහා ප්‍රමාණවත් නොවේ.

**(ආ) සාර්ව විචක්ෂණශීලී අධීක්ෂණ ක්‍රමවේදය හඳුන්වාදීම**

ඒ අනුව, පද්ධතිමය අවදානම අවම කිරීම සඳහා, සමස්තයක් ලෙස මූල්‍ය පද්ධතියෙහි ශක්තිමත්භාවය පිළිබඳ අවධාරණය කරනු ලබන සාර්ව විචක්ෂණශීලී ක්‍රමවේදයක් නියාමනය සහ අධීක්ෂණය සඳහා අනුගමනය කළ යුතු වේ. මෑතකාලීන මූල්‍ය අර්බුදයෙන් පසුව හඳුන්වාදුන් බාසල් III වැනි නියාමන ප්‍රතිසංස්කරණ මගින් ද සාර්ව විචක්ෂණශීලී සහ සූක්ෂ්ම විචක්ෂණශීලී ප්‍රවේශ අතර අන්තර් සම්බන්ධතාවන් අවධාරණය කර ඇත.

- පද්ධතිමය අවදානමෙහි කාල දෘෂ්ටිකෝණය (Time Dimension) සැලකිල්ලට ගෙන හඳුන්වා දෙනු ලබන මෙවලම්වලට උදාහරණ ලෙස තෝලන අනුපාතය, ආර්ථික චක්‍රයට ප්‍රතිවිරුද්ධව ගොඩනැගිය යුතු ප්‍රාග්ධන

ස්වාරක්ෂකය (Counter-Cyclical Capital Buffer) වැනි කාලානුරූපීව වෙනස්වන ප්‍රාග්ධන අවශ්‍යතාවන්, බාසල් III යටතට ගැනෙන ද්‍රවශීලතා ආවරණ අනුපාතය සහ ශුද්ධ ස්ථායී අරමුදල් අනුපාතය වැනි ද්‍රවශීලතා ස්වාරක්ෂක සහ වටිනාකම් මත ණය අනුපාත සහ ආන්තික අවශ්‍යතා වැනි අවස්ථානුරූපීව පනවනු ලබන නියාමන අවශ්‍යතා සහ කොන්දේසි සැලකිය හැක.

- අවදානම් සංකේන්ද්‍රණය වීම් සහ අන්තර් සම්බන්ධතා ඇසුරෙන් පැන නගින පද්ධතිමය අවදානමෙහි හරස්කඩ දෘෂ්ඨිකෝණය (Cross Section Dimension) සීමා කරන මෙවලම්වලට උදාහරණ ලෙස, ඉහළ අවදානමක් ඇති කළ හැකි ක්‍රියාකාරකම් සඳහා දැඩි ප්‍රාග්ධන නියමයන් පැනවීම, මූල්‍ය ආයතනවල අවසරලත් ක්‍රියාකාරකම්වල විෂය පථය සීමා කිරීම සැලකිය හැක. උදා:- එක්සත් රාජධානියෙහි සර් ජෝන් විකර්ස් විසින් 2012 වසරේදී ඉදිරිපත් කරන ලද ''විකර්ස් යෝජනාවලිය'' මගින්, ආයෝජන බැංකු කටයුතු, සාමාන්‍ය පාරිභෝගික බැංකු කටයුතුවලින් වෙන්කොට පවත්වාගෙන යා යුතු යැයි යෝජනා කරන ලදී.
- අධීක්ෂණ සහ නියාමන කටයුතු දැඩි කිරීම තුළින්, සහ ඉහළ ප්‍රාග්ධන මට්ටම් පවත්වාගෙන යන ලෙස නියම කිරීම තුළින් නියාමන අධිකාරීන් විසින් පද්ධතිමය වැදගත්කමක් ඇති බැංකු සම්බන්ධයෙන් යොමු කරන අවධානය ඉහළ නංවා ඇත.
- මූල්‍ය පද්ධතියෙහි විවිධ කොටස් අතර පවතින අන්තර් සම්බන්ධතා නිරූපණය කිරීම සඳහා ජාල විශ්ලේෂණය සහ සමාකරණ අභ්‍යාස, නියාමන අධිකාරීන් විසින් යොදාගැනීමට පටන්ගෙන ඇති අතර, බැංකුවල මූල්‍යමය ශක්තිමත්භාවය නිර්ණය කිරීම සඳහා ආතති පරීක්ෂණ අභ්‍යාස ද සිදුකරනු ලැබේ.

## 3. බැංකුවල අවදානම් ව්‍යුහයෙහි වෙනස්වීම් සඳහා ප්‍රතිචාර දැක්වීම

**(අ) නව අවදානම් මානයන් මතුවීම**

අවදානම් පිළිබඳ මතවාදී වෙනස්වීම්, නව නියාමන රාමු සහ සංවර්ධිත රටවල දිගින් දිගටම පැවති අඩු පොලී අනුපාත වැනි කරුණු මගින් බැංකුවල පශ්චාත්-අර්බුද හැසිරීම සහ ව්‍යාපාර ආකෘතිවල ස්වභාවය තීරණය කර ඇත. එමනිසා, බැංකුවල අවදානම් ව්‍යුහයන්හි සැලකිය යුතු වෙනස්වීම් සිදුවී ඇති අතර, මෙතෙක් සැඟව පැවති නව අවදානම් ක්ෂේත්‍ර ඉස්මතු වී, වැඩි අවධානයක් දිනාගෙන ඇත.

- සීඝ්‍රයෙන් හීනවන ලාභ ආන්තික සමඟ ලාභදායිත්වය වැඩි දියුණු කිරීම සඳහා එල්ලවන ඉහළ පීඩනය හේතුවෙන් උපාය මාර්ගික අවදානමෙහි වැදගත්කම ඉහළ ගොස් ඇත.
- එමෙන්ම, නිරන්තරයෙන් පරිණාමනය වන සුළු ස්වභාවයක් පවතින සයිබර් අවදානම කළමනාකරණය කිරීමේදී ද බැංකුවලට අභියෝගවලට මුහුණ දීමට සිදුවී ඇත. මේ වනතෙක් සයිබර් ප්‍රහාර හේතුවෙන් සිදුවී ඇති හානි සීමිත වුවත්, එමගින් දිගුකාලීන අභියෝග ඉස්මතුවීමට ඇති සම්භාවිතාව ඉහළය.
- ආකෘති අවදානම, මුදල් විශුද්ධිකරණ අවදානම, වෙළෙඳපොළ භාවිතාව පිළිබඳ අවදානම සහ නෛතික සහ අනුකූලතා අවදානම වැනි අංශවල වැදගත්කම ද ඉහළ ගොස් ඇත.

**(ආ) වඩා අවදානම් සංවේදී වන පරිදි සහ ව්‍යාපාර ආකෘති මත පදනම් වන පරිදි අධීක්ෂණ ක්‍රමවේදය ශක්තිමත් කිරීම**

මූල්‍ය පද්ධතිය ආරක්ෂා කිරීම සඳහා, නිසි පරිදි පාලනය වන ආයතනවල ස්වයං විනය ප්‍රමාණවත්ය යන පූර්ව නිගමනය මත පදනම්ව සිදුකරන ලද, ලිහිල් සහ පසුගිය සිදුවීම් මත පදනම් වූ අධීක්ෂණ ක්‍රමවේදයෙන් මේ වනවිට අධීක්ෂණ අධිකාරීන් බැහැර වී ඇත.

- අධීක්ෂණ සම්පත් කාර්යක්ෂම ලෙස කළමනාකරණය කිරීම වැඩි දියුණු කිරීමේ අපේක්ෂාවෙන් සහ සුදුසු පූර්ව අධීක්ෂණ ක්‍රියාමාර්ග ගැනීමේ අපේක්ෂාවෙන්, අනුකූලතාව පදනම් කරගත් ක්‍රමවේදයෙන් බැහැරව අවදානම් මත පදනම් වූ ක්‍රමවේදයක් ක්‍රියාවට නැංවීමට නියාමන අධිකාරීන් කටයුතු කරමින් සිටී.
- මූල්‍ය ආයතන, කාර්යක්ෂම ලෙස සහ තිරසාර පැවැත්මකින් යුතුව පවත්වාගෙන යන බව තහවුරු කිරීම සඳහා, නියාමන ක්‍රමවේදයන්හි දූරදර්ශී බව, දැඩි බව සහ ගතික බව වැඩි දියුණු

කරන ලද අතර, බැංකුවල අවදානම් ව්‍යුහය සහ ව්‍යාපාර ආකෘතිය මත පදනම්ව, එකිනෙක බැංකුවට ආවේනික අධීක්ෂණ ක්‍රියාවලියක් සිදුකිරීම සඳහා එම ක්‍රමවේද ප්‍රතිනිර්මාණය කරන ලදී.

## 4. නියාමන අධිකාරීන් අතර සහයෝගිතාව වර්ධනය කිරීම

දැවැන්ත ගෝලීය මූල්‍ය ආයතන සමූහ බිහිවීම සහ මූල්‍ය පද්ධතියේ විවිධ අංශ අතර ඇති අන්තර් සම්බන්ධතා හේතුවෙන්, දේශීයව සහ ජාත්‍යන්තර වශයෙන්, අන්තර්-නියාමන සහයෝගිතාව වර්ධනය කිරීමට නියාමන අධිකාරීන් ක්‍රියාමාර්ග ගෙන ඇත.

**(අ) කේවල අධීක්ෂණ ව්‍යුහය සහ බහුවිධ අධීක්ෂණ ව්‍යුහය**

මූල්‍ය ආයතනවල අවදානම් නිරීක්ෂණය කිරීම සඳහා සහ මූල්‍ය පද්ධති ස්ථායිතාවට සැබෑ හෝ විභව බලපෑම් එල්ල කළ හැකි අනතුරුවලට ප්‍රතිචාර දැක්වීම සඳහා, කේවල අධීක්ෂණ ව්‍යුහය වඩා ඵලදායී බව ඇතැම් රටවල්වල විශ්වාසය වේ. උදාහරණයක් ලෙස, එක්සත් රාජධානිය, ජර්මනිය, අයර්ලයන්තය, චීනය සහ භූතානය වැනි රටවල් කේවල අධීක්ෂණ ව්‍යුහයක් පිහිටුවා ඇත.

- මූල්‍ය ආයතන සමූහවල ඒකාබද්ධ අධීක්ෂණ කටයුතු සිදුකිරීමේදී සහ නියාමන ව්‍යුහයන්හි පවතින විෂමතා තුළින් පැන නගින ගැටළු අවම කිරීමේදී, මෙවැනි ක්‍රමවේදවල සාපේක්ෂ ඵලදායීතාව ඉහළය.
- එසේ වුවද, විවිධ මූල්‍ය අතරමැදි ආයතනවලට ආවේණික ලක්ෂණ හඳුනාගැනීමේදී සහ එයට අදාළ සුදුසු ක්‍රියාමාර්ග ගැනීමේදී කේවල අධීක්ෂණ ආයතනයකට වඩා අදාළ අංශය පිළිබඳ විශේෂඥ දැනුමක් පවතින ආයතන වඩා සුදුසු බව බහුවිධ අධීක්ෂණ ව්‍යුහයක් අනුමත කරන විද්වතුන්ගේ මතය වේ.
- බහුවිධ නියාමන ව්‍යුහයක් පිහිටුවා ඇති බොහෝ රටවල්, නියාමන අධිකාරීන් අතර සන්නිවේදනය සහ ප්‍රතිපත්තිමය සහයෝගිතාව තහවුරු කිරීම සඳහා ඵලදායී යාන්ත්‍රණ ඇති කරමින් සිටී. මෙවැනි පියවර අතර, එක් එක් අධීක්ෂණ ආයතනවල නියෝජිතයන්ගෙන් සමන්විත අන්තර්-නියාමන සංවිධාන පිහිටුවීම, පොදු කරුණු සඳහා ක්‍රියාකාරී කණ්ඩායම් ඇති කිරීම, තොරතුරු හුවමාරු කිරීම පිළිබඳ අවබෝධතා ගිවිසුම්වලට එළැඹීම ආදිය වේ.

**(ආ) මෑතකාලීන මූල්‍ය අර්බුදවලට පසුව අධීක්ෂණ සහයෝගිතාව වර්ධනය කිරීම**

- යුරෝපා සංගමය: විශේෂයෙන්ම මුදල් සංගමයක් තුළ, එක් රටක මූල්‍ය අංශයෙහි පවතින ගැටළු තවත් රටක් කෙරෙහි කෙතරම් වේගයෙන් සහ ප්‍රබල ලෙස පැතිර යන්නේ ද යන්න පිළිබඳව, යුරෝපා අර්බුදයෙන් පසුව සිදුකළ අධ්‍යයනයන්හිදී හෙළි විය. මෙහි ප්‍රතිඵලයක් ලෙස, යුරෝපා මහ බැංකුව සහ සහභාගි වන යුරෝපීය රටවල්වල ජාතික අධීක්ෂණ ආයතනවලින් සමන්විත කේවල අධීක්ෂණ යාන්ත්‍රණයක් 2014 නොවැම්බර් මසදී පිහිටුවන ලදී.

- එක්සත් රාජධානිය: මෙයට පෙර පැවති මූල්‍ය සේවා අධිකාරිය, මූල්‍ය භාවිතාව පිළිබඳ අධිකාරිය සහ විචක්ෂණශීලී නියාමන අධිකාරිය යන නව නියාමන ආයතන ද්විත්වයෙන් ප්‍රතිස්ථාපනය කරන ලදී. එංගලන්ත මහ බැංකුවෙහි පූර්ණ හිමිකම සහිත පාලිත සමාගමක් වන විචක්ෂණශීලී නියාමන අධිකාරිය මූල්‍ය අතරමැදිකරුවන් පිළිබඳ විචක්ෂණශීලී නියාමනය සහ අධීක්ෂණය සිදුකරන අතර, මූල්‍ය භාවිතාව පිළිබඳ අධිකාරිය පාරිභෝගික ආරක්ෂණය සහ වෙළෙඳපොළ භාවිතාව පිළිබඳ කරුණු සම්බන්ධයෙන් කටයුතු කරන ස්වාධීන ආයතනයකි. පද්ධතිමය අවදානම් හඳුනා ගැනීමට, නිරීක්ෂණය කිරීමට සහ ඒ පිළිබඳ නිසි පියවර ගැනීමට එංගලන්ත මහ බැංකුව යටතේ මූල්‍ය ප්‍රතිපත්ති කමිටුව පිහිටුවන ලදී.

**(ඇ) අන්තර් දේශසීමා තොරතුරු හුවමාරු කර ගැනීම සහ මව් රටෙහි සහ විදේශ රටෙහි නියාමන ආයතන අතර ඇති සම්බන්ධතා**

බැංකු සමූහයන්ගේ සීඝ්‍ර භූගෝලීය ව්‍යාප්තිය හේතුවෙන්, අන්තර් දේශසීමා බැංකු සමූහ අධීක්ෂණය කිරීමේ සහ අර්බුද අවස්ථාවන්හි දී නිවාරණ ක්‍රියාමාර්ග ක්‍රියාවට නැංවීමේ සංකීර්ණතාව ඉහළ ගොස් ඇත.

- බැංකු සමූහවල එලදායී අධීක්ෂණය වෙනුවෙන් තොරතුරු හුවමාරු කර ගැනීම හා සහයෝගයෙන් කටයුතු කිරීම මගින් ද, අර්බුද අවස්ථාවන් එලදායී ලෙස හැසිරවීම මගින්, මව් රටෙහි සහ විදේශ රටෙහි නියාමන ආයතන අතර සම්බන්ධතා වර්ධනය කිරීම සඳහා අධීක්ෂණ අධිකාරීන් යොමු වී ඇත. රහසිගත තොරතුරු හුවමාරු කර ගැනීම සඳහා අවිධිමත් හෝ විධිමත් (උදා:- අවබෝධතා ගිවිසුම්) ක්‍රමවේදයන් ද මේ වනවිට ක්‍රියාත්මක වෙමින් පවතී.
- නියාමන විද්‍යාල බිහිකිරීම: ප්‍රමාණාත්මක ලෙස අන්තර් දේශසීමා මෙහෙයුම් කටයුතු සිදුකරන බැංකු සමූහයන් කාර්යක්ෂමව අධීක්ෂණය කිරීම සඳහා, මව් රටෙහි නියාමන අධිකාරීන් විසින් එකිනෙක බැංකුවලට වෙන් වූ විශේෂිත නියාමන විද්‍යාල බිහි කරයි. එම බැංකු සමූහවලට අදාළ විදේශ රටවල අධීක්ෂණ අධිකාරීන් එම නියාමන විද්‍යාලවලට ඇතුළත් කරගනු ලැබේ. එමනිසා, නියාමන කටයුතු සම්බන්ධීකරණය කරනු ලබන මාධ්‍යයක් ලෙස නියාමන විද්‍යාල ක්‍රියාත්මක වේ. (උදා:- ජී 20 රටවල්, යුරෝපා සංගමය, ඉන්දියාව හා සිංගප්පූරුව)

## 5. අර්බුදවලට සූදානම්වීම සහ නිවාරණ ක්‍රමවේද

ගෝලීය මූල්‍ය අර්බුදය සමයේදී මහජන විශ්වාසය හීනවීමට පිළියමක් ලෙස, බොහෝ රටවල් තැන්පතු රක්ෂණ ක්‍රම සහ ප්‍රතිසාධන හා නිවාරණ ක්‍රියාමාර්ග වැනි මූල්‍ය සුරක්ෂිතතා ක්‍රමවේද ශක්තිමත් කොට ඇති අතර, බැංකුවලට අර්බුදවලට සූදානම් වීමේ විස්තරාත්මක සැලසුම් සකස් කිරීමට අනුබල ලබාදී ඇත.

- ඇමෙරිකා එක්සත් ජනපදය, එක්සත් රාජධානිය, හොංකොං, ජර්මනිය, මැලේසියාව සහ සිංගප්පූරුව වැනි රටවල් මෙම ගෝලීය ප්‍රතිසංස්කරණ හමුවේ තම තැන්පතු රක්ෂණ ආවරණ ඉහළ නංවා ඇත.
- හදිසි ද්‍රවශීලතා සහාය ලබාදීම, මූල්‍ය ආයතන බිඳවැටීම් නිවාරණය කිරීම, තැන්පතුකරුවන් සහ ආයෝජකයන් ආරක්ෂා කිරීම සහ විධිමත් අවිනිශ්චිතතා සැලසුම් වැනි කාලීන නියාමන නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග පිළිබඳව අවධානය යොමු කරමින්, රටවල් වැඩි සංඛ්‍යාවක් අර්බුද සමාකරණ අභ්‍යාස (Crisis Simulation Exercises) සිදුකරයි.
- 2012 වසරේදී, බැංකු අධීක්ෂණය පිළිබඳ බාසල් කමිටුව විසින් එලදායී බැංකු අධීක්ෂණයක් සඳහා වන පූර්ව කොන්දේසියක් ලෙස ප්‍රතිසාධන සහ නිවාරණ සැලසුම් හඳුනාගෙන ඇත. එමනිසා, අර්බුද තත්ත්වයන්ට අනුරූපීව විවිධ ප්‍රතිසාධන සහ නිවාරණ ක්‍රියාමාර්ග සකස් කිරීමට සහ භාවිතයට ගැනීමට නියාමන අධිකාරීන් යොමු වී ඇත.

## 6. පාරිභෝගික ආරක්ෂණ ක්‍රමවේදයන් සහ මූල්‍ය ආයතනවල වෙළෙඳපොළ භාවිතය වැඩි දියුණු කිරීම

ගෝලීය මූල්‍ය අර්බුදයෙන් සහ ප්‍රසිද්ධියට පත්වූ වෙළෙඳපොළ අවභාවිතයන් කිහිපයකින් අනතුරුව, නියාමන අධිකාරීන් විසින් පාරිභෝගික ආරක්ෂණ නීති දැඩි කරන ලදී. මූල්‍ය වෙළෙඳපොළවල් පාරිභෝගිකයන්ට වඩා සුරක්ෂිත කිරීමේ අරමුණින්, නියාමන අධිකාරීන් විසින් නව ආයතනික ව්‍යුහයන් හඳුන්වා දෙන ලද අතර, මෙයට උදාහරණ ලෙස, එක්සත් රාජධානියෙහි මූල්‍ය භාවිතාව පිළිබඳ අධිකාරිය සහ ඇමෙරිකා එක්සත් ජනපදයේ පාරිභෝගික මූල්‍ය ආරක්ෂණ කාර්යාංශය දැක්විය හැක. ඉන්දියාව, මැලේසියාව හා සිංගප්පූරුව යන කලාපීය රටවල ද මූල්‍ය වෙළෙඳපොළවල විනිවිදභාවය සහ සුපිළිපන්භාවය, සාධාරණව සැලකීම, හෙළිදරව් කිරීම් සහ මූල්‍ය අධ්‍යාපනය යනාදිය පිළිබඳ නියාමන රාමු ශක්තිමත් කර ඇත.

## 7. ශ්‍රී ලංකාව තුළ නියාමන අධිකාරීන්හි භූමිකාවේ විකාශනය

- **අධීක්ෂණ සම්බන්ධීකරණය සහ තොරතුරු හුවමාරු කර ගැනීම:** ශ්‍රී ලංකාවේ මූල්‍ය අංශය නියාමන අධිකාරීන් කිහිපයක් විසින් නියාමනය කරනු ලබන අතර, මෙම විවිධ නියාමන ආයතන අතර සම්බන්ධීකරණය වැඩි දියුණු කිරීමට බොහෝ ප්‍රයත්න දරා ඇත. උදාහරණයක් ලෙස, මූල්‍ය අංශයේ ක්‍රමවත් සංවර්ධනය හා මූල්‍ය පද්ධතියේ ස්ථායිතාව ශක්තිමත් කිරීමට අදාළ සුදුසු ප්‍රතිපත්තිමය විධානයන් පැවතීම තහවුරු කර ගැනීම සඳහා 2007 වසරේදී, මූල්‍ය අංශයේ ප්‍රධාන නියාමන අධිකාරීන්ගේ සහභාගිත්වයෙන්, අන්තර් නියාමන ආයතනික සභාව, මූල්‍ය අංශ අධීක්ෂණ කමිටුව ලෙස නැවත පිහිටුවන ලදී. මේ සඳහා පහසුකම් සැලසීමට, මූල්‍ය අංශයේ නියාමන

අධිකාරීන් අතර තොරතුරු හුවමාරු කිරීම පිළිබඳ යෝජිත පනත කැබිනට් මණ්ඩලය විසින් අනුමත කරන ලද අතර, මේ වනවිට කෙටුම්පත් කරමින් පවතී. 2015 වසරේ දී, මූල්‍ය අංශය පිළිබඳ අධීක්ෂණ කාර්යභාරය වෙත මූලිකත්වයක් දෙමින්, අන්තර් නියාමන ආයතනික සභාව නැවත පිහිටුවන ලදී. ශ්‍රී ලංකා මහ බැංකුව මේ වනවිට, පාකිස්තානු සහ ඉන්දීය මහ බැංකු, ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය සහ ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව සමඟ අවබෝධතා ගිවිසුම්වලට එළැඹී ඇත.

- **සාර්ව විචක්ෂණශීලී අධීක්ෂණය ශක්තිමත් කිරීම:** ශ්‍රී ලංකා මහ බැංකුව විසින්, පද්ධතිමය අවදානම් කල්තියා හඳුනා ගැනීම සහ ඇගැයීම සඳහා බැංකු අංශයේ සහ මූල්‍ය අංශයේ ශක්තිමත්භාවය පිළිබඳ දර්ශක, මූල්‍ය වෙළෙඳපොළ ස්ථායීතා දර්ශක සහ සාර්ව ආර්ථික ස්ථායීතා දර්ශක සංවර්ධනය කරන ලදී. තවද, දැඩි එහෙත් සිදුවිය හැකි සාර්ව ආර්ථික කම්පනවලට ඔරොත්තු දීමට මූල්‍ය පද්ධතියට ඇති හැකියාව ඇගැයීම සඳහා සාර්ව ආතති පරීක්ෂාවන් පවත්වන ලදී. පද්ධතිය තුළ ගොඩනැගෙන අවදානම්වලට පූර්ව ප්‍රතිචාර දක්වමින්, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් කලින් කලට, වටිනාකම මත ණය අනුපාත, උපරිම ණය වර්ධන සීමාවන්, ආනයන මත ආන්තික අවශ්‍යතාවන් පැනවීම යනාදී සාර්ව විචක්ෂණශීලී ක්‍රියාමාර්ග හඳුන්වා දී ඇත.
- **බාසල් III ප්‍රාග්ධන හා ද්‍රවශීලතා ප්‍රමිති ක්‍රියාවට නැංවීම:** වත්මන් නියාමන වර්ධනයන්ට අනුකූලව, බාසල් III යටතේ ද්‍රවශීලතා ආවරණ අනුපාතය 2015 වසරේදී ක්‍රියාවට නංවන ලද අතර, බාසල් III ප්‍රාග්ධන ප්‍රමිතීන් අන්තර්ජාතික කාල රාමුවලට අනුකූලව හඳුන්වාදීමට නියමිතය.
- **නියාමන රාමුව වැඩි දියුණු කිරීම:** 2015 වසර තුළදී, බැංකු හා බැංකු නොවන මූල්‍ය ආයතනවලට අදාළව පවත්නා නියාමන ප්‍රවේශය තවදුරටත් අවදානම් කෙරෙහි සංවේදී සහ පූර්ව ක්‍රියාමාර්ග ගන්නා ආකාරයට වැඩි දියුණු කරන ලදී. ඉදිරිය මත පදනම් වූ නව ක්‍රමවේදය බැංකුවල ව්‍යාපාර ව්‍යුහය වෙත අවධානය යොමුකොට බැංකුවල කාර්යක්ෂමතාව හා තිරසාර බවට බලපෑම් කළ හැකි අවදානම් හඳුනා ගැනීමට යොමු වී ඇත. මෙම සමයේදී, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නියාමනයේදී හඳුනාගත් ගැටළු නිරාකරණය කිරීම සඳහා බැංකු අධ්‍යක්ෂ මණ්ඩල සහ අධ්‍යක්ෂවරුන්ගෙන් සමන්විත උප කමිටු සක්‍රීයව දායක කර ගැනීමේ අවශ්‍යතාව අවධාරණය කරන ලදී.

ඒ අනුව, ශ්‍රී ලංකා මහ බැංකුව බැංකු පද්ධතියේ ශක්තිමත්භාවය සහ සුරක්ෂිතභාවය තහවුරු කිරීම සඳහා, බැංකු සඳහා පවතින නියාමන සහ අධීක්ෂණ රාමුව නිරතුරුවම අන්තර්ජාතික වර්ධනයන් සහ මූල්‍ය අංශයේ හා මූර්ත ආර්ථිකයේ වෙනස්වන අවශ්‍යතාවලට අනුරූපව ඇගයීමට, සමාලෝචනය කිරීමට සහ වැඩි දියුණු කිරීමට කටයුතු කරනු ඇත.

මූලාශ්‍ර:


Caruana, J (2015), Financial reform and the role of regulators: Evolving markets, evolving risks, evolving regulation

Kawai, M and Prasad, E, (2013), New Paradigms for Financial Regulation: Emerging Market Perspectives

Prudential Regulation Authority, (2013), The Prudential Regulation Authority's approach to banking supervision

World Bank, (2014), Global Survey on Consumer Protection and Financial Literacy: Oversight Frameworks and Practices in 114 Economies

Basel Committee on Banking Supervision


(උපුටා ගැනීම: ශ්‍රී ලංකා මහ බැංකු වාර්ෂික වාර්තාව - 2015)

ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

# ව්‍යවහාර මුදල් නෝට්ටු විකෘති කිරීම සහ හානි කිරීම දඬුවම් ලැබිය හැකි වරදක් බව ඔබ දන්නවාද




**සංසරණයේ පවතින ව්‍යවහාර මුදල් නෝට්ටු විශාල ප්‍රමාණයක් හිතාමතා විකෘති කර සහ/ හෝ හානි කර ඇති බව ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිරීක්ෂණය කර ඇත.**

- ☐ ව්‍යවහාර මුදල් නෝට්ටු විකෘති කිරීම හෝ හානි කිරීම 1949 අංක 58 දරන මුදල් නීති පනත යටතේ වරදක් වන අතර සිරගත කිරීම හෝ දඩ මුදලකට යටත් කිරීම හෝ එම දඬුවම් දෙකම ලබා දිය හැකිය.
- ☐ මුදල් නීති පනත යටතේ පනවන ලද අදාළ රෙගුලාසිවල (Regulation E) අංක 10 පරිච්ඡේදය යටතේ සිතාමතා විකෘති කරන ලද මුදල් නෝට්ටු ශ්‍රී ලංකා මහ බැංකුව භාරයේ රඳවා තබා ගන්නා අතර කිසිදු ගෙවීමක් සිදු නොකරයි.
- ☐ මෙම ව්‍යවහාර මුදල් නෝට්ටු සන්තකයේ තබාගන්නන් හට එම මුදල් නෝට්ටුවල මුහුණත වටිනාකමට අදාළ අලාභය දැරීමට සිදු වනු ඇත.

**ජාතික ධනය ඉතිරි කරගැනීම සඳහා ව්‍යවහාර මුදල් නෝට්ටු පරිස්සමින් සහ පිරිසිදුව භාවිත කරන මෙන් ශ්‍රී ලංකා මහ බැංකුව මහජනතාවගෙන් ඉල්ලා සිටියි.**

ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව, 30, ජනාධිපති මාවත, කොළඹ 1
+94 (0)112477726
currency@cbsl.lk
+94 (0)112477587

**ව්‍යවහාර මුදල් නෝට්ටුවක් මත ලිවීම, ඇඳීම, මුද්‍රා තැබීම, කැපීම හෝ හානි කිරීම වරදකි.**



# කාසි ඇත නිකරුනේ ඔබටමයි අලාබේ

රට තුළ භාවිතයට නොගෙන නිකරුනේ තිබෙන කාසි සංඛ්‍යාව අති විශාලයි.

මෙම කාසි සංසරණයට මුදා හැරීම තුළින් අලුතින් කාසි අච්චු ගැසීමට සාපේක්ෂ ව අප රටට විශාල මුදලක් ඉතිරිකර ගැනීමට පුළුවන්. කාසි අලුතින් අච්චු ගැසීමට දරන අධික වියදම ඔබට දිගුකාලීන පාඩුවක් අත්කර දීමට පුළුවන්.

ඒ නිසා ඔබ සතුව නිකරුනේ පවතින කාසි සියල්ල ප්‍රයෝජනයට ගන්න.

රාජගිරිය, ශ්‍රී ජයවර්ධනපුර මාවතේ, අංක 58 දරන ස්ථානයේ පිහිටි ශ්‍රී ලංකා මහ බැංකු මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලදුව,
ශ්‍රී ලංකා මහ බැංකුවේ සන්නිවේදන දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලදී.